# 1 වැනි පරිච්ඡේදය

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

නිදහස ලබාගැනීමෙන් පසු ප්‍රථම වරට ශ්‍රී ලංකා ආර්ථිකය, අඛණ්ඩව තෙවැනි වතාවටත් 2007 වසරේ දී සියයට 6 කට වඩා වැඩි වර්ධන වේගයක් වාර්තා කළ අතර, ශ්‍රී ලංකාව සියයට 4-5 පමණ වූ ඓතිහාසික සාමාන්‍ය වර්ධන වේගයක සිට සියයට 6 කට වඩා ඉහළ වර්ධන මාවතකට පිවිස ඇති බව මෙයින් පෙනීයයි. 2007 වසරේ දී ආර්ථික වර්ධන වේගය සියයට 6.8 ක් වූ අතර, සාමාන්‍ය වාර්ෂික සේවාවියුක්ති අනුපාතය මෙතෙක් වාර්තා වූ අඩුම අනුපාතය වන සියයට 6.0 ක් ද, ඒක පුද්ගල ආදායම තවදුරටත් ඉහළ ගොස් එක්සත් ජනපද ඩොලර් 1,617 ක් ද විය. ත්‍රස්තවාදී ක්‍රියා ඉහළ යාමත් සමග ආරක්ෂක තත්ත්වයන් දැඩි කිරීම හා මිල ස්ථායීතාවය ළඟාකර ගැනීමට තර්ජනයක් වූ ජාත්‍යන්තර වෙළෙඳපොළ තෙල් මිල හා අනෙකුත් භාණ්ඩ මිල ඉහළ යාම වැනි අභියෝග හමුවේ අත්කරගත් මෙම ක්‍රියාකාරිත්වය ඉතා ප්‍රශංසනීය වේ. මහ බැංකුව විසින් පවත්වාගෙන ගිය දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි සඵලතාවය පෙන්නුම් කරමින් මුදල් සමස්තයන්හි වර්ධනයේ අඩුවීමක් සිදු වූ අතර, ඒ අනුව 2007 වර්ෂය තුළ දී සමස්ත ඉල්ලුම ද තරමක් දුරට අඩුවීම සිදුවිය. මහ බැංකුව විසින් දැඩි හා වඩා ශික්ෂණයක් සහිත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වාගෙන යනු ලැබුව ද, බාහිර මිල කම්පනයන් හා සැපයුම් කම්පනයන් තුළින් ඉල්ලුම් කළමනාකරණ ප්‍රයත්නයන්ගෙන් අපේක්ෂිත ප්‍රතිඵල නිශේධනය වීම අපේක්ෂා නොකළ තත්ත්වයකි. මෙම විදේශීය මිල වැඩිවීම හා සැපයුම් අංශයේ කම්පන වසරේ දෙවන භාගය තුළ දී උද්ධමනය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යාමට හේතු විය. රජය විසින් අනුගමනය කළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාදාමය නිවැරදි දිශාවකට ගමන් කරනු දක්නට ලැබුණි. වර්ෂය තුළ රාජ්‍ය ආදායම් අපේක්ෂිත මට්ටමට වඩා අඩු වුවද,



රාජ්‍ය අයවැය හිඟය මෙන්ම රාජ්‍ය ණය ද මෑත වර්ෂවල නිරීක්ෂණය කරනු ලැබූ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් තවදුරටත් යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. මෙම තත්ත්වය ළඟා කරගත හැකිවූයේ රජය විසින් මුහුණ දුන් සුවිශේෂ අභියෝග වූ ඉහළ යමින් පැවති ආරක්ෂක වියදම්, ඉහළ නැගුණ දේශීය පොලී අනුපාතික හා වේගයෙන් ඉහළ යන්නා වූ භාණ්ඩ හා සේවා වියදම පාලනය සඳහා බදු හා තීරු බදු සහන ලබාදීමට සිදුවීම යනාදිය මධ්‍යයේය. මේ සමගම, රජය අනාගත ආර්ථික වර්ධනයට පහසුකම් සලසනු පිණිස රටේ ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් පුළුල් කිරීම ඉලක්ක කර ගත් රාජ්‍ය ආයෝජන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. දේශීය බැංකු ක්‍රමය තුළින් ණය ලබාගැනීම මගින් අයවැය හිඟය මූල්‍යනය කිරීම සංශෝධිත රාජ්‍ය මූල්‍ය ඉලක්කවලින් අපේක්ෂා කළ මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවැති නමුත් එය සැළකිය යුතු මට්ටමකින් අඩුකර ගැනීමට රජයට හැකිවීම යහපත් ප්‍රවනතාවයක් වූ අතර, මෙය දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට උපකාරී වන ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පවත්වා ගැනීමක් ලෙස සැලකිය හැකිය.

**ගෙවුම් ශේෂ අතිරික්තය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 531 ක් වාර්තා කරමින් විදේශීය අංශය විදේශීය කම්පනවලට මුහුණ දීමට ඇති ශක්තිය මැනවින් පිළිබිඹු කළ අතර, එමගින් රටෙහි විදේශීය සංචිත ඉහළ නැංවීමත් විදේශ විනිමය අනුපාත ස්ථායීතාව ඉහළ යාමත් සිදුවිය.** ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සම්බන්ධව විදේශීය ආයෝජකයින්ගේ විශ්වසනීයත්වය පිළිබිඹු කරමින් මෙතෙක් ලැබූ ඉහළම ඍජු විදේශීය ආයෝජන ප්‍රමාණය වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 734 ක් 2007 වර්ෂය තුළ දී වාර්තා විය. අපනයනයන්හි ඉහළ වර්ධනය හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල තිරසාර වැඩිවීම තුළින් වූ විදේශීය විනිමය ලැබීම් හේතුවෙන් ඛණිජ තෙල් හා ආනයන භාණ්ඩ මිල ඉහළ යාමෙන් ආනයන වියදම කෙරෙහි වූ අධික බලපෑම තරමක් දුරට සමනය වූ අතර, යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වූ ඉහළ වියදමෙහි කොටසක් ණය හා විදේශ ඍජු ආයෝජන ලැබීම් වර්ධනය තුළින් මූල්‍යනය කරන ලදී. කෙසේ වෙතත්, ණය වශයෙන් විශාල ලෙස විදේශ විනිමය ලැබීම රුපියල අධිප්‍රමාණය වීමටත් ඒ තුළින් අපනයන තරඟකාරිත්වයට අභියෝගයක්වීමටත් හේතුවන අතර, මුදල් සැපයුමෙහි විශාල ප්‍රසාරණයක් ඇතිවීම තුළින් මුදල් කළමනාකරණයට ද අභියෝගයක් විය හැකිය.


**මූල්‍ය අංශය අඛණ්ඩව ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළ අතර, අයහපත් ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන්ට හා ඉහළ යමින් පැවති දේශීය පොලී අනුපාතිකයන්හි බලපෑම්වලට සාර්ථකව මුහුණ දීමට මූල්‍ය අංශයට හැකිවිය.** ඉහළ ලාභදායිත්වය, ශක්තිමත් ප්‍රාග්ධනීකරණය, වත්කම්වල ගුණාත්මක භාවය වැඩිදියුණු වීම හා උසස් අවදානම් කළමනාකරණය හේතුවෙන් පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතන දියුණු මූල්‍ය තත්ත්වයක් පවත්වාගෙන ගිය අතර, මේ තුළින් පීඩනකාරී පරිසරයක් තුළ කටයුතු කිරීමේ හැකියාව පුළුල් විය. නව විචක්ෂණශීලී නියාමනයන් කිහිපයක්ම ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මූල්‍ය පද්ධතියට අදාළ නියාමනයන් හා අධීක්ෂණයන් තවදුරටත් ශක්තිමත් කරන ලද අතර, පද්ධතිමය වශයෙන් වැදගත්කමක් දරන ගෙවීම් හා පියවීම් පද්ධතිය මූල්‍ය ක්‍රමය තුළ කටයුතුවලට ඉතා ඉහළ දායකත්වයක් හා ආරක්ෂණයක් සපයන ලදී. මේ නිසා මූල්‍ය පද්ධතියට කෙටිකාලීන අවදානම්වලට සාර්ථකව මුහුණ දීමේ ශක්තියක් පවතින අතර, අවදානම්වලට හා ඕනෑම අයහපත් තත්ත්වයන්ට මුහුණදීමට හැකිවන පරිදි ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග හේතුවෙන් මූල්‍ය පද්ධති ස්ථායීතා ඉදිරි දැක්ම ද යහපත් වනු ඇත.

## 1.2 2007 වසරේ සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායීතාව හා ප්‍රතිපත්ති සඳහා ප්‍රතිචාර

### මූර්ත අංශයේ වර්ධනයන්

2007 වසරේ ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් **කර්මාන්ත සහ සේවා අංශ පිළිවෙළින් සියයට 7.6 කින් සහ සියයට 7.1 කින් වර්ධනය වීමත් කෘෂිකර්මාන්ත අංශය සියයට 3.3 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය වීමත් දායක විය.** සමස්ත වර්ධනයට සේවා අංශය සියයට 62 ක ඉහළම දායකත්වයක් ලබාදුන් අතර, කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත අංශවල දායකත්වයන් පිළිවෙළින් සියයට 32 ක් සහ සියයට 6 ක් විය. කෙසේ වුවත්, සේවා, කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත අංශවල ද.දේ.නි.යට ඇති දායකත්වයන් පිළිවෙළින් සියයට 60, සියයට 28 සහ සියයට 12 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. සේවා අංශයෙහි, තැපැල් සහ විදුලි සංදේශ, වරාය භාණ්ඩ මෙහෙයවීම, ප්‍රවාහනය සහ මූල්‍ය සේවාවන් කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්වූ ප්‍රධාන අංශයන් වේ. නිෂ්පාදන අංශය තුළ ඉදිකිරීම්, අපනයන නිෂ්පාදන සහ පතල් සහ කැණීම් කටයුතු ඉහළ ප්‍රගතියක් පෙන්වීය. බොහෝ කෘෂිකාර්මික කටයුතුවල සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධන වේගයක් පැවතිය ද, ප්‍රධාන බෝග දෙකක් වූ තේ සහ වීවල නිමැවුම පහත වැටීම එම අංශයේ සමස්ත වර්ධන ප්‍රගතිය අඩු කිරීමට හේතු විය. ආර්ථිකය පුළුල්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් ජනිත වීම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතය 2006 දී වාර්තා වූ සියයට 6.5 ක සිට 2007 දී සියයට 6.0 දක්වා පහත වැටුණ

**1.1 රූප සටහන** **ආර්ථික වර්ධනය සහ සේවා වියුක්තිය**




අතර, එය මෙතෙක් වාර්තා වූ අඩුම වාර්ෂික විරැකියා අනුපාතය වේ.

**2007 දී තේ නිෂ්පාදනය හැරුණු විට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ බොහෝ උප අංශයන් හි කටයුතු සාපේක්ෂව ඉහළ වර්ධන වේගයක් වාර්තා කරන ලදී.** ශ්‍රී ලංකා තේවල තත්ත්වය වර්ධනය කිරීම සහ එකතුකළ අගය වැඩි කිරීම සඳහා අඛණ්ඩව දරන ලද උත්සාහයන්හි ප්‍රතිඵලයක් වශයෙන් 2007 දී ශ්‍රී ලංකා තේවල මිල ගෝලීය මිලෙහි සාමාන්‍යයට වඩා ඉහළ ගිය අතර, එමගින් 2007 වර්ෂයෙහි තේ නිෂ්පාදනය අඩුවීමේ බලපෑම ද සමනය විය. රබර් සඳහා ආකර්ෂණීය මිල ගණන් පැවතීම සහ නව තාක්ෂණය උපයෝගී කර ගැනීම රබර් නිෂ්පාදනය වැඩිවීමට හේතු විය. රබර් අංශයේ සංවර්ධනය සඳහා වගාකරුවන්ට අවශ්‍ය පහසුකම් සැපයීම වැඩි කිරීම සහ ව්‍යාප්ති සේවා වර්ධනය කිරීම තුළින් වගාබිම් ප්‍රමාණය වැඩිකිරීමට පියවර ගෙන තිබේ. යහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් පොල් නිෂ්පාදනය සියයට 3 කින් වර්ධනය විය. එහෙත් ඛනිජ තෙල්වල මිල ඉහළ යාමට විකල්පයක් වශයෙන් ජීව ඩීසල් නිෂ්පාදනය කිරීම පිණිස කාබනික තෙල්වලට ඇති ලෝක ඉල්ලුම වැඩිවීම පිළිබිඹු කරමින් වර්ෂය තුළ පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල තියුණු ලෙස වැඩිවිය.

**ගෝලීය වෙළෙඳපොළෙහි කිරිපිටි මිල තියුණු ලෙස ඉහළ යාමත් සමග, දේශීය කිරි කර්මාන්තය නැගී එන වැදගත් අංශයක් ලෙස හඳුනාගෙන තිබේ.** පෞද්ගලික අංශයේ දායකත්වය ඇතිව කිරි ගොවීන් ධෛර්යවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර තිබේ. කිරි ගවයින් ආනයනය කිරීම, සත්ත්ව ගොවිපළ සංවර්ධනය කිරීම සහ කුඩා

**1.1 සංඛ්‍යා සටහන** **කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2002) යටතේ දළ ජාතික නිෂ්පාදිතය**

| අංශය | වටිනාකම (රු.ද.ල) | | ද.දේ.නි.% ලෙස | | වෙනස්වීමේ අනුපාතිකය% | | වෙනස්වීමට දායකත්වය% | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2006 | 2007(අ) | 2006 | 2007(අ) | 2006 | 2007(අ) | 2006 | 2007(අ) |
| **කෘෂිකාර්මික අංශය** | **257,131** | **265,586** | **12.3** | **11.9** | **6.3** | **3.3** | **10.3** | **6.0** |
| කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය | 235,872 | 241,010 | 11.3 | 10.8 | 3.4 | 2.2 | 5.3 | 3.6 |
| ධීවර කර්මාන්තය | 21,260 | 24,576 | 1.0 | 1.1 | 53.5 | 15.6 | 5.0 | 2.3 |
| **කාර්මික අංශය** | **590,298** | **635,199** | **28.2** | **28.5** | **8.1** | **7.6** | **29.8** | **31.7** |
| පතල් හා කැනීම් | 35,769 | 42,631 | 1.7 | 1.9 | 24.2 | 19.2 | 4.7 | 4.8 |
| නිෂ්පාදන කර්මාන්ත | 370,355 | 394,233 | 17.7 | 17.7 | 5.5 | 6.4 | 13.1 | 16.8 |
| විදුලිය, ගෑස් සහ ජලය | 52,926 | 55,339 | 2.5 | 2.5 | 14.8 | 4.6 | 4.6 | 1.7 |
| ඉදිකිරීම් | 131,248 | 142,996 | 6.3 | 6.4 | 9.2 | 9.0 | 7.4 | 8.3 |
| **සේවා අංශය** | **1,243,119** | **1,331,602** | **59.5** | **59.6** | **7.7** | **7.1** | **60.0** | **62.4** |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 514,511 | 546,145 | 24.6 | 24.5 | 7.1 | 6.1 | 22.9 | 22.3 |
| හෝටල් සහ ආපනශාලා | 9,411 | 9,199 | 0.5 | 0.4 | 2.5 | -2.3 | 0.2 | -0.1 |
| ප්‍රවාහනය සහ සන්නිවේදනය | 259,546 | 286,779 | 12.4 | 12.8 | 12.6 | 10.5 | 19.4 | 19.2 |
| බැංකු, රක්ෂණ සහ දේපල වෙළෙඳාම් යනාදිය | 177,817 | 193,375 | 8.5 | 8.7 | 8.5 | 8.7 | 9.4 | 11.0 |
| නිවාස අයිතිය | 71,533 | 72,345 | 3.4 | 3.2 | 1.1 | 1.1 | 0.5 | 0.6 |
| රාජ්‍ය සේවා | 161,611 | 171,259 | 7.7 | 7.7 | 5.0 | 6.0 | 5.2 | 6.8 |
| පෞද්ගලික සේවා | 48,689 | 52,500 | 2.3 | 2.4 | 7.8 | 7.8 | 2.4 | 2.7 |
| **දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **2,090,548** | **2,232,387** | **100.0** | **100.0** | **7.7** | **6.8** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | -28,757 | -24,251 | | | -20.9 | 15.7 | | |
| **දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.)** | **2,061,791** | **2,208,137** | | | **7.5** | **7.1** | | |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සහ මධ්‍යම පරිමාණයේ කිරි නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සහනදායී පොලී අනුපාතිකවලට සැපයීම සඳහා 2008 වසරේ අයවැයෙන් යෝජනා කර තිබේ. 2008 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය කිරි භාවිතා කොට නිෂ්පාදනය කෙරෙන කිරි සහ කිරි නිෂ්පාදිත එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කොට ඇත. කිරි නිෂ්පාදන අංශයේ යටිතල පහසුකම් සංවර්ධනයට සහ පශු වෛද්‍ය සේවාවන් ගමට ලබාදීම පිණිස අලුතින් පශු වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමට ද කටයුතු යොදා තිබේ. ගම් මට්ටමින් පශු වෛද්‍ය සායන ස්ථාපනය කර තිබෙන අතර, පශු සම්පත් අංශයේ සෞඛ්‍ය වැඩසටහන් පැවැත්වීමත් අවශ්‍ය උපකරණ සැපයීමත් සිදුවිය. ගව සත්ත්වය ඉහළ නැංවීම පිණිස කිරි නිෂ්පාදනය සඳහා තත්ත්වයෙන් උසස් දෙනුන් ලබාගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගෙන තිබෙන අතර, කිරි දෙනුන් ඝාතනය කිරීම සම්බන්ධ දඩ මුදල වැඩි කිරීමෙන් කිරි දෙනුන් ඝාතනය කිරීම වැළැක්වීමට පියවර ගෙන තිබේ.

**සුනාමි ව්‍යවසනයේ බලපෑමට පසුව වසර 2007 දී මත්ස්‍ය නිෂ්පාදනය මෙතෙක් වාර්තා වූ ඉහළම නිෂ්පාදනය වන කිලෝග්‍රෑම් දශ ලක්ෂ 291 දක්වා සියයට 16 ක වර්ධනයක් වාර්තා කරමින් සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත්විය.** මුහුදු හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය පිළිවෙළින් සියයට 17 කින් සහ සියයට 9 කින් වර්ධනය විය. ඉහළ මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකා ධීවර සංස්ථාව සෘජුවම මාළු මිලදී ගැනීමට මැදිහත්වීම සහ අධිශීතකරණ පහසුකම් සහිත ධීවර සංස්ථා ට්‍රක්රථ මගින් මාළු බෙදාහැරීම නිසා වසරේ වැඩි කාලයක් තුළ මාළු මිල සාමාන්‍යයෙන් ස්ථාවරව පැවැතිණි. මත්ස්‍ය නිෂ්පාදනය තවදුරටත් ඉහළ නැංවීමට සහ මුහුදු සම්පත උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත (විශේෂ සටහන 5).

**දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමේ අදහසින් 2007 වර්ෂයේ දී රජය ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්කළේය.** දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකිරීම සහ ඉහළ යන භාණ්ඩ හා සේවා වියදම මැඩපවත්වා ගැනීම අරමුණු කරගෙන “අපි වවමු - රට නගමු” තේමාව යටතේ ජාතික ව්‍යාපාරයක් අරඹා ඇත. මෙම ව්‍යාපාරය යටතේ දේශීය කෘෂි ඵලදායීතාව වර්ධනය කිරීමේ අදහසින් ගොවියාට නව තාක්ෂණය ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

**2007 දී කාර්මික අංශයේ සිදුවූ වර්ධනයට ප්‍රධාන වශයෙන්ම නිමැවුම් කර්මාන්ත අංශයේ වර්ධනය හේතු විය.** අපනයන වෙළෙඳපොළ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදිතයන්ගේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් සහ ප්‍රාදේශීය ආදායම් අසමානතාවයට පිළියම් ලෙස ප්‍රදේශීය කාර්මීකරණය සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා රජය අඛණ්ඩව යොමුවිය. කර්මාන්ත පිහිටුවීම, විශේෂ වැඩසටහන් මගින් ඒවා ප්‍රති-ස්ථානගත කිරීම හෝ පුළුල් කිරීම සඳහා බදු හා තීරුබදු සහන ලබාදීම, නව ආර්ථික කලාප හා කාර්මික උද්‍යානයන් පිහිටුවීම, විශ්වවිද්‍යාල පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා මගින් මානව සම්පත් සංවර්ධනය, වෙළෙඳ පොළවල්වලට ප්‍රවිෂ්ටවීම සඳහා පහසුකම් පුළුල් කිරීම සහ වෙළෙඳ නාමයන් ප්‍රවර්ධන කටයුතු 2007 වර්ෂයේදී රජය මගින් කර්මාන්ත අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ගන්නා ලද ප්‍රධාන ක්‍රියාමාර්ගයන්ය. මේ අතර, 2007 වසරේ දී කාර්මික අංශයේ ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා, යුරෝපා සංගමයට අයත් රටවල් විසින් ප්‍රදානය කරන ලද වෙළෙඳවරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) සහ ද්වීපාර්ශ්වික කලාපීය වෙළෙඳ ගිවිසුම් විශාල වශයෙන් බලපෑවේය. කෙසේ වුවද, කර්මාන්ත අංශයට එවැනි වෙළෙඳ වරණයන්ගෙන් තොරව තරග කිරීමට හැකියාව පැවතිය යුතු ය. එයට හේතුව වෙළෙඳවරණයන් පිළිබඳ පොදු ක්‍රමය වැනි අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක නොවන ගිවිසුම්, ආර්ථිකමය නොවන වෙනත් හේතූන් වල බලපෑම නිසා ඉවත් කර ගැනීමට ඉඩ ඇති බැවිනි (විශේෂ සටහන 12).


**වෙළෙඳවරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ ලැබුණු බදු සහන භාවිතය වැඩිවීමත් සමග රෙදිපිළි ඇඟලුම් හා සම්භාණ්ඩ නිෂ්පාදනය ආදී අපනයනය කේන්ද්‍ර කරගත් ප්‍රධාන කර්මාන්තයන් හි ඉහළ නිමැවුමක් වාර්තා කළේය.** 2007 වසරේ දී රබර් ආශ්‍රිත නිෂ්පාදන, දියමන්ති සැකසීම, ලෝහමය නිෂ්පාදන, යන්ත්‍ර හා ප්‍රවාහන උපාංග නිෂ්පාදන සහ මැණික් හා ස්වර්ණාභරණ වැනි වෙනත් අපනයන වෙළෙඳාභිමුඛ කර්මාන්තයන්හි ද ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේය. දේශීය අංශයෙහි පවතින ඉහළ ඉල්ලුම හේතුවෙන් ආහාර ද්‍රව්‍ය, බීම වර්ග, සිමෙන්ති, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්ලාස්ටික් හා පී.වී.සී. නිෂ්පාදිත ආදී නිෂ්පාදන වර්ධනය විය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉහළ වර්ධනයට හේතුවූයේ රජය විසින් දියත් කළ විදුලිබල උත්පාදනය, වරාය හා මහාමාර්ග, වාරිමාර්ග ව්‍යාපෘති ඇතුළත් මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල වර්ධනය මෙන්ම පෞද්ගලික අංශයේ නිවාස දේපළ කටයුතුවල වර්ධනය පිළිබිඹු කරමින් සිමෙන්ති, ගොඩනැගිලි ද්‍රව්‍ය හා සකස් කළ ලෝහ, නිෂ්පාදනවල සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනවල වර්ධනයයි. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය තව දුරටත් වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිතය ඉහළ නැංවීම මගින් ඵලදායීතාව ඉහළ නැංවීම, නිෂ්පාදිත තත්ත්වය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වැඩි දියුණු කිරීම මගින් තරගකාරිත්වය වැඩි දියුණු කිරීම, ඉහළ

යන ඉන්ධන හා බලශක්ති පිරිවැය අඩුකරලීමට අවශ්‍ය බලශක්ති කාර්යක්ෂම ක්‍රමවේදයන් හඳුන්වාදීම, පසු සබඳතා ප්‍රවර්ධනය කිරීම හා කම්කරු නීති හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කිරීම යන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කළයුතු ය.

**ප්‍රධාන වශයෙන්, අයහපත් ආරක්ෂක තත්ත්වය මෙන්ම ආනයන හා දේශීය වෙළෙඳ කටයුතුවල සිදුවූ පසුබෑම සමග 2007 දී හෝටල් හා ආපන ශාලා උපඅංශයේ සංකෝචනය නිසා සේවා අංශයේ එකතු කළ අගය ද පහළ යාම සිදු විය.** විදේශීය ඉල්ලුම වැඩිවීම පිළිබිඹු කරමින් අපනයන, වෙළෙඳ සේවා සහ වරාය හා සම්බන්ධ සේවා මගින් සේවා අංශයේ වර්ධනය ප්‍රධාන වශයෙන් සිදුවූ අතර, එයට බැංකු හා විදුලි සංදේශ සේවා වැනි දේශීය ආර්ථිකය පදනම් කරගත් සේවාවන් මගින් ද වැදගත් දායකත්වයක් සැපයිණ. විදුලි සංදේශ සේවා අංශය පිළිබඳව සලකන විට ආවරණ ජාලය තව දුරටත් පුළුල් වීම, උසස් තාක්ෂණය හා එකතු කළ සේවාවන් හඳුන්වාදීම, තරගකාරිත්වය ඉහළ යාම, එම සේවාවන් ලබාගැනීමට ඇති හැකියාව සහ එම අංශය තුළ ආයෝජන ඉහළ යාම යන කරුණු හේතුවෙන් 2007 දී ඉහළ වර්ධනයක් අඛණ්ඩව පැවතිණි. වර්ෂය තුළදී නව විදුලි සංදේශ සේවා කිහිපයක්ම ක්‍රියාත්මක වූ අතර, එමගින් සේවාවේ ධාරිතාවය, තාක්ෂණය, ආවරණ ජාලය සහ සේවා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සිදුවිය.

**දේශීය සමස්ත ඉල්ලුමෙහි මූර්ත අගය අඩුවීම මගින් මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තියෙහි සඵල බව පිළිබිඹු විය.** පරිභෝජන මෙන්ම ආයෝජන ඉල්ලුමෙහි මූර්ත අගය 2006 දී පිළිවෙළින් සියයට 7.1 සහ සියයට 13.4 සිට 2007 දී පිළිවෙළින් සියයට 4.9 සහ සියයට 8.7 දක්වා අඩුවිය. භාණ්ඩ හා සේවා ආනයන සඳහා ඉල්ලුම අඩුවීම

**1.2 රූප සටහන** **ඉතිරිකිරීම් සහ ආයෝජන**




**1.2 සංඛ්‍යා සටහන** **සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් ආයෝජන පරතරය 2006-2007**

| ශීර්ෂය | රු. බිලියන | | වර්ධනය % | | ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007 (අ) | 2006 | 2007 (අ) | 2006 | 2007 (අ) |
| **1. දේශීය ඉල්ලුම** | **3,262.0** | **3,946.4** | **22.1** | **21.0** | **111.0** | **110.3** |
| 1.1 පරිභෝජනය | 2,439.8 | 2,949.7 | 21.2 | 20.9 | 83.0 | 82.4 |
| පෞද්ගලික | 1,988.4 | 2,403.2 | 17.5 | 20.9 | 67.7 | 67.2 |
| රාජ්‍ය | 451.4 | 546.5 | 40.6 | 21.1 | 15.4 | 15.3 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 822.2 | 996.7 | 25.0 | 21.2 | 28.0 | 27.9 |
| පෞද්ගලික | 703.0 | 804.5 | 27.9 | 14.4 | 23.9 | 22.5 |
| රාජ්‍ය | 119.2 | 192.2 | 10.0 | 61.3 | 4.1 | 5.4 |
| **2. ශුද්ධ බාහිර ඉල්ලුම** | **-323.4** | **-368.0** | **-47.6** | **-13.8** | **-11.0** | **-10.3** |
| භාණ්ඩ හා සේවා අපනයනය | 885.4 | 1,046.1 | 11.6 | 18.1 | 30.1 | 29.2 |
| භාණ්ඩ හා සේවා ආනයනය | 1,208.8 | 1,414.1 | 19.4 | 17.0 | 41.1 | 39.5 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි) (1) + (2)** | **2,938.7** | **3,578.4** | **19.8** | **21.8** | **100.0** | **100.0** |
| **4. දේශිය ඉතිරි කිරීම් (3) - (1.1)** | **498.8** | **628.7** | **13.6** | **26.0** | **17.0** | **17.6** |
| පෞද්ගලික | 569.0 | 686.4 | 13.2 | 20.6 | 19.4 | 19.2 |
| රාජ්‍ය | -70.1 | -57.7 | -10.3 | 17.7 | -2.4 | -1.6 |
| **5. විදේශීය ශුද්ධ සාධක ආදායම** | **-40.4** | **-38.8** | **-34.5** | **4.0** | **-1.4** | **-1.1** |
| **6. විදේශීය ශුද්ධ පෞද්ගලික ජංගම සංක්‍රාම** | **197.9** | **245.0** | **13.4** | **23.8** | **6.7** | **6.8** |
| **7. ජාතික ඉතිරි කිරීම් (4) + (5) + (6)** | **656.3** | **834.9** | **12.5** | **27.2** | **22.3** | **23.3** |
| **8. ඉතිරි කිරීම් ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම් - ආයෝජන (4) - (1.2) | -323.4 | -368.0 | | | -11.0 | -10.3 |
| ජාතික ඉතිරි කිරීම් - ආයෝජන (7) - (1.2) | -165.9 | -161.8 | | | -5.6 | -4.5 |
| **9. නිල ප්‍රදානයන් හැර විදේශීය ජංගම ගිණුම් හිඟය (2) + (5) + (6)** | **-165.9** | **-161.8** | | | **-5.6** | **-4.5** |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

තුළින් ද දේශීය සමස්ත ඉල්ලුම පහත බැසීම පෙන්නුම් කරන ලදී. කෙසේ වුවත්, එයින් සමස්ත වර්ධනයට වූ බලපෑම සමනය කිරීමට වැඩි වූ විදේශීය ඉල්ලුම හේතු විය. භාණ්ඩ හා සේවා අපනයනවල මූර්ත වර්ධනය 2006 පැවති සියයට 3.8 හා සසඳන විට 2007 දී සියයට 6.8 ක් විය.

**2007 දී ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස ඉතිරි කිරීම්-ආයෝජන පරතරය වර්ධනය විය.** රජයට සිය නිර්-ඉතිරිකිරීම් අඩු කරගත හැකි වූ අතර, එය සමස්ත දේශීය ඉතිරි කිරීම් වැඩිවීමට හේතුවිය. කෙසේ වුවද, තවමත් සියයට 10 ක පමණ ඉහළ මට්ටමක පවතින දේශීය ඉතිරිකිරීම්-ආයෝජන පරතරය, අවශ්‍ය ආර්ථික වර්ධන වේගය ළඟාකර ගතහැකි වන ලෙස පියවා ගැනීම සඳහා විදේශීය ප්‍රාග්ධනය හා විදේශීය

**1.3 සංඛ්‍යා සටහන** — **විදේශීය අංශයේ සංවර්ධනයන්**

| ශීර්ෂය | එ.ජ.ඩො. දශ ලක්ෂ 2006 | එ.ජ.ඩො. දශ ලක්ෂ 2007(අ) | වර්ධනය % |
|---|---|---|---|
| **අපනයන** | **6,883** | **7,740** | **12.5** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 1,293 | 1,507 | 16.6 |
| කාර්මික නිෂ්පාදන | 5,401 | 5,920 | 9.6 |
| ඛණිජමය අපනයන | 120 | 129 | 7.7 |
| වෙනත් අපනයන | 69 | 184 | 166.2 |
| **ආනයන** | **10,254** | **11,301** | **10.2** |
| පාරිභෝගික භාණ්ඩ | 1,980 | 2,002 | 1.1 |
| අතරමැදි භාණ්ඩ | 5,962 | 6,513 | 9.2 |
| ආයෝජන භාණ්ඩ | 2,246 | 2,685 | 19.6 |
| වෙනත් | 65 | 100 | 53.2 |
| **වෙළෙඳ ශේෂය** | **-3,371** | **-3,560** | **-5.6** |
| **සේවා, ශුද්ධ** | **257** | **239** | **-7.0** |
| ලැබීම් | 1,625 | 1,711 | 5.3 |
| ගෙවීම් | 1,368 | 1,473 | 7.6 |
| **ආදායම්, ශුද්ධ** | **-389** | **-358** | **7.9** |
| ලැබීම් | 311 | 449 | 44.3 |
| ගෙවීම් | 700 | 807 | 15.3 |
| **ජංගම සංක්‍රාම, ශුද්ධ** | **2,005** | **2,311** | **15.3** |
| පෞද්ගලික ප්‍රේෂණ, ශුද්ධ | 1,904 | 2,214 | 16.3 |
| ලැබීම් | 2,161 | 2,502 | 15.8 |
| ගෙවීම් | 257 | 288 | 11.9 |
| නිල සංක්‍රාම, ශුද්ධ | 101 | 97 | -4.0 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-1,499** | **-1,369** | **8.7** |
| **ප්‍රාග්ධන ගිණුම** | **291** | **269** | **-7.4** |
| **මූල්‍ය ගිණුම** | **1,517** | **1,828** | **20.5** |
| සෘජු ආයෝජන, ශුද්ධ | 451 | 548 | 21.6 |
| ලැබීම් | 480 | 603 | 25.6 |
| ගෙවීම් | 29 | 55 | 87.1 |
| පෞද්ගලික දිගුකාලීන, ශුද්ධ | -35 | 31 | 188.6 |
| ලැබීම් | 139 | 199 | 43.3 |
| ගෙවීම් | 174 | 168 | -3.4 |
| රජයේ දිගුකාලීන, ශුද්ධ | 491 | 672 | 36.9 |
| ලැබීම් | 932 | 1,290 | 38.4 |
| ගෙවීම් | 441 | 618 | 40.1 |
| රජයේ කෙටිකාලීන, ශුද්ධ | 0 | 372 | |
| කෙටිකාලීන | 610 | 205 | -66.4 |
| එයින්: විවිධ ආයෝජන ශුද්ධ | 51 | 101 | 99.2 |
| වැරදීම් සහ අත්හැරීම් | -105 | -198 | |
| **සමස්ත ශේෂය** | **204** | **531** | |
| දළ නිල වත්කම් (ආ.නි.ස. ලැබීම් ඇතුළත් නොවූ) | 2,526 | 3,063 | |
| ආනයන මාස ගණන | 3.0 | 3.3 | |
| මුළු විදේශ වත්කම් (ආ.නි.ස. ලැබීම් ඇතුළත් නොවූ) | 3,695 | 4,511 | |
| ආනයන මාස ගණන | 4.3 | 4.8 | |
| අපනයන මිල දර්ශකය | 103.3 | 108.3 | |
| ආනයන මිල දර්ශකය | 107.0 | 113.3 | |
| වෙළෙඳ අනුපාතය | 96.6 | 95.6 | |
| **විනිමය අනුපාත (සාමාන්‍යය)** | | | අධිප්‍රමාණ (+), අවප්‍රමාණ(-) |
| රුපියල්/එ.ජ. ඩොලර් | 103.96 | 110.62 | -6.0 |
| රුපියල්/යෙන් | 0.89 | 0.94 | -5.0 |
| රුපියල්/යුරෝ | 130.63 | 151.63 | -13.8 |
| රුපියල්/බ්‍රිතාන්‍ය පවුම් | 191.53 | 221.46 | -13.5 |

(අ) තාවකාලික


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවක ප්‍රේෂණ වැදගත් දායකත්වයක් ලබාදී ඇති බව පෙන්නුම් කරයි. දළ දේශීය ආයෝජන, ද.දේ.නි යෙන් සියයට 28 ක් වූ අතර, එය 2006 වසරේ පැවැති මට්ටමට බොහෝ දුරට සමාන විය. මේ අතර, දේශීය ඉතිරිකිරීම් අනුපාතය 2006 දී වූ සියයට 17 සිට 2007 දී සියයට 17.6 දක්වා වර්ධනය විය. රාජ්‍ය මූල්‍ය කටයුතුවල වූ වර්තන ගිණුමේ හිඟය අඩුවීම හේතුවෙන් 2006 දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.4 ක් වූ නිර්-ඉතිරිකිරීම් අනුපාතය, 2007 දී සියයට 1.6 දක්වා අඩු කිරීමට රජයට හැකි වූ අතර, එය දේශීය ඉතිරිකිරීම් අනුපාතයේ සමස්ත වර්ධනයට දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය ඉතිරිකිරීම්-ආයෝජන පරතරය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 2006 දී සියයට 11.0 සිට 2007 දී සියයට 10.3 දක්වා පහත වැටිණි. විදේශීය ප්‍රේෂණයන් ලෙස ලැබෙන විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ඉතිරිකිරීම්, සමස්ත ඉතිරිකිරීම්-ආයෝජන පරතරය සියයට 4.5 කට අඩු කිරීමට උපකාරී වූ අතර, එය ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුම් හිඟය වැඩිදියුණු කිරීමට ද හේතුවිය. සෘජු විදේශීය ආයෝජන ලැබීම්, රජයට ලැබුණු ණය හා ප්‍රදානයන් සහ කොටස් වෙළෙඳපොළ ආයෝජන මගින් ඉතිරි පරතරය මූල්‍යනය කරන ලදී. දේශීය ඉතිරිකිරීම්, ආයෝජනවල වර්ධනයට වඩා වැඩි වේගයකින් වර්ධනය නොවීමට ඉඩ ඇති බැවින් සහ ඉහළ තිරසාර ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා මැදිකාලීනව ඉහළ ආයෝජන අවශ්‍යතාවයන් පවතින බැවින්, ඉතිරිකිරීම් - ආයෝජන පරතරය මැදි කාලයේ දී ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## විදේශීය අංශයේ සංවර්ධනයන්

**අපනයන සහ විදේශීය ප්‍රේෂණවල වර්ධනය සහ ඉහළ ප්‍රාග්ධන ලැබීම්වලින් ශක්තිමත් වුණු විදේශීය ඉල්ලුම 2007 වසරේ ආර්ථික වර්ධනය සහ ස්ථායීතාව සඳහා ප්‍රධාන පිටුවහලක් විය.** විවිධ වෙළෙඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට ලැබුණු විශේෂ වාසිදායක තත්ත්වයන් ද, අපනයන වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා රජය සහ දේශීය ව්‍යවසායකයන් විසින් ගනු ලැබූ ආරම්භක පියවරයන් ද, 2007 වසරේ වැඩි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ මිලදී ගනු ලබන රටවල ඇති වූ ආර්ථික සමෘද්ධිමත්භාවය ද හේතුවෙන් ලංකාවට ප්‍රධාන වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ටවීමේ හැකියාව වර්ධනය විය. 2007 වසරේ දී තේ අපනයන ඉපැයුම් එ.ජ.ඩොලර් බිලියන 1 සීමාව ද ඉක්මවා යාමත් සමගම, විදේශ විනිමය ඉපැයීම්වල ප්‍රධාන මූලාශ්‍රයන් වන රෙදිපිළි හා ඇඟළුම් සහ තේ අපනයන වලින් වූ විදේශ විනිමය ලැබීම් තවදුරටත් ඉහළ ගියේය. අපනයනවල අනෙකුත් ප්‍රධාන කාණ්ඩයන් වන යන්ත්‍ර

**1.3 රූප සටහන** **ඛනිජ තෙල් ආනයන වටිනාකම සහ ආනයනය කරන ලද බොරතෙල්වල සාමාන්‍ය මිල**





සූත්‍ර හා උපකරණ, ආහාර පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදන සහ දියමන්ති හා ස්වර්ණාභරණ යනාදියෙහි ද වර්ධනයන් වාර්තා කළේය. ආනයන වර්ධනයට සාපේක්ෂව ඉහළ අපනයන වර්ධනය, 2007 වර්ෂයේ වෙළෙඳ හිඟය පුළුල් වීම සීමාකිරීමට උපකාරී විය. 2006 වසරේ දී එ.ජ.ඩොලර් වටිනාකම අනුව සියයට 34 කින් වර්ධනය වූ වෙළෙඳ හිඟය හා සසඳන විට 2007 දී එය වර්ධනය වූයේ සියයට 5.6 කින් පමණක් වන අතර, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස ද වර්ෂය තුළ දී වෙළෙඳ හිඟයෙහි යහපත් වර්ධනයක් දක්නට ලැබුණි. රජය විසින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති මෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන කටයුතු සඳහා අවශ්‍ය ආයෝජන භාණ්ඩ ආනයන වියදම් ඉහළ යාම සමස්ත ආනයන වියදම් ඉහළ යාම, සඳහා දායක විය. සංචාරක කටයුතුවලින් ලද ඉපැයුම් පහත වැටුණ ද, ප්‍රවාහනය, තොරතුරු තාක්ෂණය හා ඒ ආශ්‍රිත සේවාවන් වැනි සේවා අපනයනයන්හි ඉපැයුම් තව දුරටත් ඉහළ ගියේය. වසරේ මුල් භාගයේ දී තියුණු ලෙස පහත වැටුණු සංචාරක පැමිණීම් වසරේ දෙවන භාගයේ දී සැලකිය යුතු ලෙස නැවත යථා තත්ත්වයට පත්විය. බහාලු මෙහෙයුම් කටයුතුවල ධාරිතාවය ඉහළ යාම නිසා වරාය ආශ්‍රිත කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය වීම, ශ්‍රී ලංකන් ගුවන් සේවයෙහි ගුවන් ගමනාන්ත පුළුල් කිරීම සහ ගුවන් ගමන් පැය සහ වාර ගණන වැඩි කිරීම යනාදී කරුණු හේතුවෙන් ප්‍රවාහණ සේවාවලින් වූ දළ ලැබීම් වඩා යහපත් මට්ටමක පැවතින.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, විදේශීය විනිමය ලැබීම්වල ප්‍රධාන ප්‍රභවයක් වූ අතර, 2007 වර්ෂයේ වෙළෙඳ ගිණුමේ හිඟයෙන් සියයට 70 ක් මූල්‍යනය කිරීමට එය ප්‍රමාණවත් විය.** අඛණ්ඩව තුන් වන වසරටත් ඉහළ වේගයකින් වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2007 වර්ෂයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,502 ක් විය. සේවා ගිණුමේ අතිරික්තය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම, ජංගම ගිණුමේ හිඟය සීමාකිරීමට උපකාරී විය. 2006 වර්ෂයේ දී, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.3 ක් වූ ජංගම ගිණුමේ හිඟය, 2007 වර්ෂයේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.2 ක් දක්වා අඩු විය.

**විදේශ විනිමය ලැබීම් ඉහළ යාම හේතුවෙන් 2007 වර්ෂයේ දී ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම වර්ධනයක් වාර්තා කළේය.** සංවර්ධන හවුල්කරුවන්ගෙන් ප්‍රදාන වශයෙන් රජයට ලැබෙන ප්‍රාග්ධන ස්වභාවයේ ආධාර වාර්තා කරනු ලබන ප්‍රාග්ධන ගිණුමට 2007 වර්ෂයේ දී ලැබුණු ආධාරවල අගය 2006 වර්ෂයේ ලද ආධාර වල අගයට සමාන මට්ටමක පැවතිණ. ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් විසින් ලබාගන්නා ලද විදේශීය ණය ද ඇතුළුව දළ විදේශීය සෘජු ආයෝජන ලැබීම් අගය 2006 වර්ෂයේ පැවති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 604 සිට 2007 වර්ෂයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 734 දක්වා වාර්තාගත ලෙස වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ආයෝජන මණ්ඩලය යටතේ වූ, විශේෂයෙන්ම සේවා අංශයේ ව්‍යාපාරවල රඳවා ගත් ඉපැයීම් නැවත ආයෝජනය කිරීම ශීඝ්‍ර ලෙස ඉහළ යාමයි. වර්ෂය තුළ රජයට ලැබුණු සමස්ත දිගු හා මැදිකාලීන ණය ලැබීම් 2006 වසරේ පැවති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 932 සමග සැසඳීමේදී 2007 දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,290 දක්වා ඉහළ ගියේය. ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ නොපියවූ භාණ්ඩාගාර බැඳුම්කර සමස්ත අගයෙන් සියයට 10 ක් දක්වා ප්‍රමාණයක් අනේවාසිකයින්ට විවෘත කිරීම රජයේ විදේශීය ලැබීම් ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඇමරිකාවේ උප ප්‍රාථමික උකස් වෙළෙඳපොළ ගැටලුව නිසා ජාත්‍යන්තර කොටස් වෙළෙඳපොළවල කැළඹිලි සහිත තත්ත්වයක් පැවතියද, ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ආයෝජකයන්ගේ ඇති විශ්වාසය තහවුරු කරමින්, කොළඹ කොටස් හුවමාරුව දළ හා ශුද්ධ යන දෙආකාරයෙන්ම වැඩි විදේශීය ලැබීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට

**1.4 රූප සටහන** **ගෙවුම් තුලනය**



සමත් විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, මූල්‍ය ගිණුමෙහි අතිරික්තය 2006 වර්ෂයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,517 හා සසඳනවිට 2007 වර්ෂයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,828 ක් දක්වා වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ඒකාබද්ධ අතිරික්තය සැලකිය යුතු ලෙස වැඩිවූ අතර, එය ජංගම ගිණුමේ හිඟය පියවීමට අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ගිය බැවින් සමස්ත ගෙවුම් තුලනයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 531 ක අතිරික්තයක් ඇති විය. ඒ අනුව රටේ නිල විදේශීය සංචිත සතුටුදායක මට්ටමක් දක්වා වර්ධනය වූ අතර, එය මාස තුනකටත් වඩා වැඩි ආනයන ප්‍රමාණයක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වෙමින් කම්පනයන්ට මුහුණ දීමට රටේ විදේශීය අංශයට ඇති හැකියාව වර්ධනය කළේය.

**දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය, 2006 වර්ෂයේ දී සියයට 43.3 සිට 2007 වර්ෂයේ දී සියයට 44.1 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.** මෙයට මූලික වශයෙන් හේතුවූයේ දේශීය පොලී අනුපාතික ඉහළයමින් පැවති වාතාවරණයක් තුළ රජය සිය අයවැය හිඟය මූල්‍යනය කිරීමට විදේශීය මූලාශ්‍ර කෙරෙහි වැඩි වශයෙන් යොමු වීමයි. මෙම ක්‍රමෝපාය හේතුවෙන් දේශීය වෙළෙඳ පොළ සම්පත් මත වූ පීඩනය අඩු වූ අතර, එම සම්පත් පෞද්ගලික අංශයට ලබාගත හැකි වීම නිසා එය වසර අග භාගයේ දී දේශීය පොලී අනුපාතික ස්ථායී කිරීමට ද උපකාරී විය. කෙසේ වුවත්, ණය සහ සාර්ව ආර්ථික ස්ථායීතාවය ඉහළ නැංවීම සඳහා රජයේ විදේශීය ණය සම්බන්ධව පැවති යහපත් උපනතීන් තවදුරටත් පවත්වාගෙන යාම වැදගත් වේ.


**පාවෙන විනිමය අනුපාත ක්‍රමය යටතේ, ශ්‍රී ලංකා රුපියල, ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව දිගින් දිගටම අවප්‍රමාණය වන මුදල් වර්ගයක් ලෙස තවදුරටත් සැලකිය නොහැකිය.** දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ පරිණත වීමත් සමග, විනිමය අනුපාතය ඉල්ලුම් සහ සැපයුම් යන වෙළෙඳපොළ බලවේගවලට ප්‍රතිචාර දක්වමින් තීරණය වන අතර, වෙළෙඳපොළ තුල අධික උච්චාවචනයන් අඩු කිරීමට සහ නිල විදේශ සංචිත ඉහළ නැංවීමට පමණක් ශ්‍රී ලංකා මහ බැංකුව සීමිත ලෙස මැදිහත් වේ. වසරේ පළමු කාර්තු තුන තුළ එ.ජ.ඩොලරයට එරෙහිව වැඩි අනුපාතයකින් අවප්‍රමාණය වූ රුපියල, නව ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් නිසා අවසන් කාර්තුවේ දී අධිප්‍රමාණය වූ අතර, 2007 වර්ෂය අගවන විට සියයට 0.9 ක සුළු අවප්‍රමාණයක් පමණක් වාර්තා කළේය. ශ්‍රී ලංකා රුපියලේ මෑත දී සිදු වූ ස්ථායී වීම මගින් අපනයන සහ ආනයන තරගකාරී අංශ විදේශ තරගකාරිත්වය පවත්වා ගැනීම සඳහා ඵලදායිතාවය වර්ධනය කර ගැනීම කෙරෙහි වැඩියෙන් අවධානය යොමුකිරීමේ අවශ්‍යතාවය සහ වෙළෙඳපොළ ප්‍රවේශයන් වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරයි.

**ශ්‍රී ලංකාව විසින් 2007 වසරේ ඔක්තෝබර් මාසයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 500 ක ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව, සාර්ථකව නිම කළේය.** උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළ ගැටලුව ජාත්‍යන්තර වෙළෙඳපොළවලට අහිතකර අයුරින් බලපා තිබිය දී පවා, රටේ පවතින ස්ථායී ආර්ථික මූලිකාංග, ආයෝජනයට හිතකර පරිසරය, අනාගත වර්ධන හැකියාවන් සහ නොකැළැල් ණය සේවාකරණ වාර්තා යන කරුණු බැඳුම්කර නිකුතුව සාර්ථක වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. බැඳුම්කර නිකුතුවත් සමග ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළේ තම පැවැත්ම තහවුරු කරගෙන ඇති අතර, වෙළෙඳපොළවෙත ප්‍රවේශය ද පුළුල් කරගෙන ඇත. ශ්‍රී ලංකාව, මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත්වීමත් සමග සාම්ප්‍රදායික සංවර්ධන හවුල්කරුවන්ගෙන් සහනදායී ණය ලබා ගැනීමේ අවස්ථා අඩුවීම පිළිබඳව සලකන විට මෙය යහපත් ප්‍රවණතාවකි. මෙම බැඳුම්කර නිකුතුවෙන් පසු ජාත්‍යන්තර ආයෝජන ප්‍රජාව මෙන්ම ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන ලංකාවේ සාර්ව ආර්ථික වර්ධනයන් පිළිබඳව වඩාත් සමීපව විමර්ශනය කරන බැවින් එය ලංකාවට සිය සාර්ව ආර්ථික තත්ත්වයන් හොඳින් පවත්වාගෙන යාමට ස්වයං පෙළඹවීමක් ඇති කර ඇත (විශේෂ සටහන 15).

### රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්

**රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුවට පදනම වූ "දස අවුරුදු දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් මෙම වසර තුළදීත්, නොකඩවා ක්‍රියාත්මක විය.** ඉහළ හා තිරසාර ආර්ථික වර්ධනයක් ළඟාකර ගන්නා අතර, තවදුරටත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම කෙරෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොමුවිය. ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීමට ත්‍රස්තවාදය මර්දනය සඳහා වන ක්‍රියාමාර්ග පුළුල් කිරීමේ අවශ්‍යතාවය, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවති උද්ධමන හා උද්ධමනකාරී පීඩනය, තියුනු ලෙස ඉහළ යමින් පැවති ජාත්‍යන්තර ඛනිජ තෙල් හා වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් සහ සීඝ්‍ර ලෙස ඉහළ ගිය දේශීය පොලී අනුපාතික වැනි අභියෝග මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය ඉලක්ක ඉටුකර ගැනීමට විශේෂ ප්‍රයත්න දැරීමට සිදුවිය. මෙම අභියෝග නිසා 2007 අයවැය සඳහා පාදක වූ උපකල්පන අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක නොවූ බැවින් ඉලක්ක ළඟාකර ගැනීමට එයින් බලපෑමක් ඇති විය. මෙවැනි අහිතකර උපනතීන් මධ්‍යයේ වුව ද, රාජ්‍ය මූල්‍ය අංශය, ආරම්භයේ දී බලාපොරොත්තු වූ වේගයට වඩා මඳක් අඩු වේගයකින්

**1.5 රූප සටහන** **රාජ්‍ය ආදායම, වියදම සහ අයවැය හිගය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස)**





වුවත් අඛණ්ඩව සිය වර්ධන ප්‍රවණතාව පවත්වා ගැනීමට සමත් විය. මෙම සංවර්ධනයන් පැවතිය ද, පුනරාවර්තන වියදම් අපේක්ෂිත මට්ටම ඉක්මවා යෑම, ආදායම් අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීම, රාජ්‍ය ආයෝජනයන්හි ක්‍රියාකාරිත්වය අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම, තවදුරටත් ණය කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය, ප්‍රධාන රාජ්‍ය වෙළෙඳ ව්‍යවසායයන්ගේ සහ රාජ්‍ය ව්‍යවසායයන්ගේ දුර්වල මූල්‍ය ක්‍රියාකාරිත්වය වැනි කරුණු නිසා රාජ්‍ය මූල්‍ය අංශය තවමත් පීඩා විඳී. එබැවින් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම සහ ණය කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා විශේෂ ප්‍රයත්න දැරීම අවශ්‍යව ඇත.

**2006 වසර හා සැසඳීමේ දී 2007 වසරේ දී නාමික අගය අනුව මුළු රාජ්‍ය ආදායම සියයට 18.3 කින් වර්ධනය විය.** බදු පරිපාලනය තවදුරටත් ශක්තිමත් කිරීම, බදු දිරිගැන්වීම් සහ බදු නිදහස් කිරීම් තාර්කීකරණය කිරීම බදු අනුකූලතාවයන් සහ බදු ගෙවීමට කරන පෙළඹවීම් තර කිරීම වැනි රජය විසින් ගන්නා ලද අඛණ්ඩ උත්සාහයන් මෙම වර්ධනයට හේතුවිය. එහෙත් මුළු ආදායම, අයවැයෙන් අපේක්ෂිත ආදායමට වඩා අඩුවිය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවූයේ ඉහළයන භාණ්ඩ හා සේවා වියදම හේතුවෙන් අත්‍යවශ්‍ය ආනයන වෙළෙඳ ද්‍රව්‍ය සඳහා බදු සහන ලබාදීම සහ 2007 වර්ෂයේ ආනයනය කරන ලද වාහන ප්‍රමාණය සහ එහි අගය අඩුවීමයි. ඉහළ යන ඛනිජ තෙල් මිල නිසා ඇතිවන බලපෑම පාලනය කිරීමේ පියවරක් ලෙස රජය අධික ලෙස ඉන්ධන වැයවන වාහන ආනයනය අධෛර්වත් කිරීමට තීරුබදු වැඩිකිරීම සිදුකළ අතර එයට ප්‍රතිචාරයක් ලෙස අඩු වටිනාකමක් සහිත මෝටර් රථ ආනයනය කළ නිසා 2007 වර්ෂයේ දී ආනයනය කළ මෝටර් රථ සංඛ්‍යාව සහ එහි වටිනාකම අඩු විය. මෙම හේතුන් දෙක නිසා පමණක් අහිමි වූ ආදායම රුපියල් බිලියන 24 ක් (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 0.7) ලෙස ඇස්තමේන්තු කර ඇත. මුළු ආදායම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2006 දී සියයට 16.3 ක සිට 2007 දී සියයට 15.8 දක්වා අඩුවිය. 2006 වසරේ දී ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සියයට 6.0 ක් වූ රාජ්‍ය ආයෝජනවල වර්ධනය වීමේ උපනතිය මෙම වසරේදීත් නොකඩවා පවත්වා ගත් අතර, එය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.4 ක් විය. මෙම වර්ධනයට, යටිතල පහසුකම් සඳහා වන විශාල ව්‍යාපෘති පිළිබඳ අවධානය යොමුකරමින් ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම දායක විය. කෙසේ වුවද, රාජ්‍ය ආයෝජන අනුපාතයේ සත්‍ය අගය එහි මුල් පුරෝකතන අගය වූ සියයට 8.6 ට වඩා සැළකිය යුතු අඩු මට්ටමක පැවතිණි. ප්‍රධාන වශයෙන් ජාතික ආරක්ෂාව, වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප් සහ පොලී ගෙවීම්, වැනි වියදම් අයවැයෙන් වෙන්කරන ලද ප්‍රමාණය ඉක්මවා යෑම හේතුවෙන් පුනරාවර්තන වියදම් ඒ සඳහා පැවති ඉලක්ක අබිබවා ගියේය. මෙම වර්ධනයන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2007 වසරේ දී ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිගය සියයට 7.7 ක් වූ අතර, එය මුල් අයවැය මගින් පුරෝකතනය කළ සියයට 8.4 ට හා 2006 වසරේ පැවති සියයට 8.0 ට වඩා අඩු මට්ටමක් විය.

**අයවැය හිගය මූල්‍යනය කිරීමේ මාර්ග විවිධාංගීකරණය කිරීමේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස 2007 වසරේ දී අයවැය හිගය මූල්‍යනය කළ ක්‍රමයන්හි පැහැදිලි වෙනසක් දක්නට ලැබිණි.** මෙම තත්ත්වය යටතේ, රජය විසින් සිදුකළ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව මෑතක දී හඳුන්වාදුන් ප්‍රධානතම මූල්‍යන උපකරණය ලෙස සැලකිය හැකිය. ඉහළ යන හා විචලනය වන දේශීය වෙළෙඳපොළ පොලී අනුපාතික තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් විදේශීය ණය ගැනීම් කෙරෙහි රජය

**1.6 රූප සටහන** **රාජ්‍ය ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස)**



වැඩි අවධානයක් යොමු කළේය. කෙසේ වුවද, වැඩි වශයෙන් විදේශ ණය ලබාගැනීම නිසා ණය සමස්තය තුළ තිබෙන විනිමය අනුපාත අවදානම ඉහළ යන බැවින් එය ඥානාන්විතව කළමනාකරණය කළ යුතු ය. 2007 වසරේ සමස්ත අයවැය හිඟයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශීය මූලාශ්‍රවලින් පියවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය මූලයන්ගෙන් මූල්‍යනය කළ ප්‍රමාණය අයවැයගත මට්ටමට වඩා අඩු විය. බැංකු ක්‍රමය තුළින් ලබාගත් ණය මුලින් අපේක්ෂිත මට්ටමට වඩා සුළු වශයෙන් අඩු වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. ප්‍රථම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් හා රුපියල් අගයෙන් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ විදේශ ආයෝජකයන්ගෙන් ලැබුණු මුදල් ප්‍රවාහ හේතුවෙන් 2007 වර්ෂය තුළ දී රාජ්‍ය ණය ලබා ගැනීම සඳහා බැංකු ක්‍රමය මත වූ පීඩනය සාපේක්ෂ වශයෙන් අඩුවිය.

**රාජ්‍ය ණය දරාගැනීමේ හැකියාව වැඩි දියුණු කරමින්, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2006 වසරේ සියයට 88.7 ක් වූ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2007 වසරේ දී සියයට 85.8 ක් දක්වා නොකඩවා පහත වැටිණි.** මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ 2007 අවසාන කාලය වන විට රුපියල අනෙකුත් ප්‍රධාන විදේශ මුදල්වලට එරෙහිව ස්ථායීවීම සහ නාමික ආර්ථික වර්ධනයට සාපේක්ෂව නොපියවූ ණයවල අඩු වර්ධනයයි. 2007 වසරේ දී මුළු රාජ්‍ය ණයවල නාමික වටිනාකම රුපියල් බිලියන 3,070 දක්වා රුපියල් බිලියන 462 කින් වැඩිවිය. මේ අතර, ණය සේවා ගෙවීම් දර්ශක කිහිපයක ද තවදුරටත් යහපත් ක්‍රියාකාරිත්වයක් පැවතිණි. කෙසේ වුවද, රජයේ අයවැය කටයුතු මත ඇතිවන පීඩනය අවම කිරීම සඳහා දේශීය ණය කල්පිරීම් රටාව සුමට ලෙස පාලනය කළ යුතු ය. විදේශීය මුදල් අගයෙන් යුත් වාණිජ ණය කල්පිරීම් කෙටි කාලයකට ඒකරාශීවීම වැළැක්වීම පිණිස කල්පිරීම් ව්‍යුහය දීර්ඝ කිරීම ද සිදුකළ යුතු ය.


**2007 වසරේ දී යම් වර්ධනයක් වාර්තා වුවද, රාජ්‍ය මූල්‍ය අංශයෙහි පවතින ප්‍රධාන පසුබෑම් කිහිපයක් නිසා එම අංශය තවදුරටත් පීඩා විඳී.** රාජ්‍ය ආදායම අඩුවීම හා පුනරාවර්තන වියදම් ඉහළ යෑම තුළින් ඇති වන අමතර අරමුදල් අවශ්‍යතාවය නිසා ණය ප්‍රමාණය සහ අනාගත පොලී වියදම ඉහළයයි. 2007 වසරේ දී, රැස්කරගත් රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම සැලකිල්ලට ගෙන එම අවදානම පාලනය කිරීම සඳහා වර්ෂය තුලදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන අතර, එසේ නොවුවහොත් 2008 වසරේ රජයේ ආදායම් ඉලක්කයන් සපුරා ගැනීම ද අභියෝගයක් වනු ඇත. පුනරාවර්තන වියදම් ඉලක්කගත ප්‍රමාණයට වඩා ඉහළ යෑම හේතුවෙන් රාජ්‍ය ආයෝජන වෙනුවෙන් රජයේ ආදායමෙන් යොදවන ප්‍රමාණය අවශ්‍ය මට්ටමට වඩා අඩු වන අතර, එය රටේ දිගුකාලීන ආර්ථික අභිවෘද්ධිය ළඟාකර ගැනීමට බාධාවක් වේ. එම මුදල් ප්‍රාග්ධන ආයෝජන සඳහා යෙදවූයේ නම්, ආර්ථිකයට ලබා ගත හැකිව තිබූ ප්‍රතිලාභ පිළිබඳව සළකන විට මෙවැනි වියදම් නිසා ඇතිවන ආවස්ථික පිරිවැය ඉතා අධිකය. තවද, රාජ්‍ය ආයෝජන කටයුතුවල මන්දගාමී ස්වභාවය නිසා ප්‍රමාද වන යටිතල පහසුකම් ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීමට ඉහළයන වෙළෙඳ ද්‍රව්‍ය මිලගණන් යටතේ විශාල සම්පත් ප්‍රමාණයක් වැය කිරීමට සිදුවේ. එසේම රාජ්‍ය ව්‍යවසායයන්ගේ (SOEs) මූල්‍ය ශක්‍යතාවය පිළිබඳව ද අවධානය යොමු විය යුතු ව ඇත.

**2007-2010 මැදි කාලීන රාජ්‍ය අයවැය රාමුව සහ දස අවුරුදු දැක්ම යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශන දෙකෙහිම, මෙම දුර්වලතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට රජයේ ඇති කැපවීම සඳහන් කර ඇත.** රාජ්‍ය මූල්‍ය සමස්තයන් දැරිය නොහැකි මට්ටමකට පත්වීම තුළින් ඇතිවිය හැකි ප්‍රතිඵල පිළිබඳව රජය අවධානයෙන් සිටින බව මෙමගින් පෙන්වා දෙයි. ඒ අනුව, සමස්ත අයවැය හිඟය දැරිය හැකි මට්ටමක පවත්වාගැනීම මූලික කොට සලකන අතර, එය සමස්ත රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියේම මූලික අභිප්‍රාය වී ඇත. දැනටමත් සැලසුම් කර ඇති ක්‍රියාමාර්ග නිසි කලට ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වන අතර, යම් ලෙසකින් ඉලක්ක ඉටුකර ගත නොහැකි වුවහොත් එය ආර්ථිකයේ සමස්ත සාර්ව ආර්ථික කළමනාකරණ ක්‍රියාවලියටම අහිතකර ලෙස බලපානු ඇත. විශේෂයෙන් එමගින් මුදල් කළමනාකරණය වඩාත් අසීරු තත්ත්වයකට පත්වීම සිදුවිය හැකි අතර, දිළිඳුකම අඩුකිරීම සහ ප්‍රාදේශීය ආර්ථික අසමතුලිතතාව තිරසාර පදනමක් මත අඩු කිරීම සඳහා අපේක්ෂිත ඉලක්කගත තිරසාර සහ ඉහළ ආර්ථික වර්ධනය සහ ආර්ථික ස්ථායීතාවය ඇතිකර ගැනීමේ අරමුණ ඉටු කර ගැනීමට එය බාධාවක් වනු ඇත.

### මුදල් අංශයේ වර්ධනයන්

**ඉහළ යන උද්ධමනාත්මක පීඩනයන් පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් 2007 වසර තුළදී තම දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කරන ලදී.** මෙම වසර තුළදී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය, මුදල් සමස්තයන්හි දැඩි ප්‍රමාණාත්මක ඉලක්ක නොඉක්මවන ලෙස පවත්වා ගැනීම දෙසට නැඹුරුව පැවැති අතර, ඒ අනුව අධි ඉල්ලුම දැඩි ලෙස සීමා කළහැකිවන පරිදි වෙළෙඳ පොළ පොලී අනුපාතික ඉහළ යාමට ඉඩ හරින ලදී. මේ අනුව, මහ බැංකුව විසින් තම “2007 හා ඉන් ඉදිරිය සඳහා මුදල්

**1.7 රූප සටහන** **සංචිත මුදල් සහ පුළුල් මුදල් වර්ධනය**





හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" තුළින් 2007 වසර ආරම්භයේදී එම වසර සඳහා වූ මුදල් ප්‍රතිපත්ති අරමුණු, උපාය මාර්ග සහ ඉලක්ක ප්‍රකාශයට පත්කරන ලදී. 2007 වසර සඳහා මුදල් ඉලක්ක නියම කිරීමේදී එම වසර තුළ අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන්ට අමතරව, 2006 වසරේදී දක්නට ලැබුණ ඉහළ මුදල් ප්‍රසාරණය ද සැලකිල්ලට ගන්නා ලදී. මේ අනුව, 2007 වසර සඳහා වඩාත් දැඩි මුදල් ඉලක්ක නියම කරන ලද අතර, එම ඉලක්ක ලඟාකරගත හැකි පරිදි දැඩි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. 2007 වසර මුලදී මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම්, ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රති විකුණුම් අනුපාතික පදනම් අංක 50 කින් ඉහළ නංවන ලදී. විවට වෙළෙඳ කටයුතු දැඩි ලෙස පවත්වාගෙන යන ලද අතර, බැංකුවල ණය මැවීමේ හැකියාව ඍජුවම සීමා කෙරෙන පරිදි බැංකු විසින් මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් පහසුකම භාවිතා කිරීම මත යම් සීමා පනවන ලදී. එයට අමතරව, අධික ණය ප්‍රසාරණය සීමාකිරීම සඳහා ශිෂ්ට ප්‍රයෝග ද යොදාගන්නා ලදී. එමෙන්ම, අඩු ගුණාත්වයක් සහිත ණය ප්‍රසාරණය නිසා සිදුවිය හැකි හානි අවම කිරීමේ අදහසින් 2006 වසරේදී බැංකු සඳහා හඳුන්වාදුන් විචක්ෂණශීලී ප්‍රතිපත්තීන් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. 2004 අග සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 350 කින් ඉහළ නැංවුව ද, මුදල් ප්‍රසාරණය මත එහි බලපෑම දක්නට යම් කාලයක් ගතවන බැවින්, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වේගවත් කිරීම සඳහා මේ ආකාරයෙන් ප්‍රමාණාත්මක ඉලක්ක කෙරෙහි වැඩි නැඹුරුවක් සහිත උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලදී.

**සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ ඉලක්ක හා සංසන්දනාත්මකව ඒවායෙහි වර්ධනය විමර්ශනය කළහැකි වන පරිදි, නව අධීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වා දෙමින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කරන ලදී.** මුදල් ප්‍රතිපත්ති ඉලක්ක මත බලපෑම් ඇති කරනු ලබන ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් හඳුනාගන්නා ලද අතර, එම විචල්‍යයන්ගේ වර්ධනයන් නිර්ණය කළහැකි වන පුළුල් අධීක්ෂණ යාන්ත්‍රණයක් 2007 වසර ආරම්භයේ දී හඳුන්වා දෙන ලදී. ප්‍රතිපත්ති විචල්‍යයන්හි අපේක්ෂිත මට්ටමට වඩා යම් වෙනසක් සිදුවිය හැකි බව මහ බැංකුවට පෙනී යන විට ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස රජයට පූර්ව දැනුම්දීමක් කිරීමට මෙම යාන්ත්‍රණය උපකාරී විය. පෞද්ගලික අංශයේ නියෝජිතයන් සහ විද්වතුන් වැනි විවිධ පාර්ශ්වකරුවන්ගේ විශේෂඥතාව ලබාගනිමින් මුදල් ප්‍රතිපත්ති තීරණගැනීමේ ක්‍රියාවලිය වඩාත් සවිමත් කිරීම උදෙසා මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් (Monetary Policy Consultative Committee-MPCC) පිහිටුවන ලදී.

**ප්‍රමාණාත්මක ඉලක්ක කෙරෙහි වඩාත් යොමුවූ මුදල් ප්‍රතිපත්ති උපාය මාර්ගය මුදල් ප්‍රසාරණය සීමාකිරීමට සහ එමගින් ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය අඩුකිරීමට වඩාත් ඵලදායී විය.** සංචිත මුදල්හි වර්ධනය ඉලක්කගත මට්ටමේ පවත්වාගත හැකි වූ අතර, පසුගිය පස් අවුරුදු කාලපරිච්ඡේදය තුළ දක්නට ලැබුණ අඩුම වර්ධන වේගය වූ සියයට 10.2 කට එය සීමා කළහැකි විය. එමගින් 2006 දී දක්නට ලැබුණ අධික මුදල් ප්‍රසාරණයේ බලපෑම සම්පූර්ණයෙන්ම පාහේ නිශේධනය කල හැකිවිය. නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය වූ සියයට 21.8 හා සංසන්දනය කරන විට සංචිත මුදල් හි වර්ධනය දැඩි ලෙස සීමාකරන ලද වූ වර්ධනයක් විය. පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය මුදල් වැඩසටහනෙහි දක්වා තිබූ ඉලක්කයන්ට වඩා ඉහළ මටටමක පැවැතිය ද, සංචිත මුදල් වර්ධනය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස එය ද අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්වීය. 2007 වසරෙහි මුදල් සැපයුමෙහි ප්‍රසාරණයට ශුද්ධ විදේශ වත්කම්වල මෙන්ම ශුද්ධ දේශීය වත්කම්වල වර්ධනය ද දායක විය. ශුද්ධ දේශීය වත්කම් තුළ, පෞද්ගලික අංශය වෙත දෙන ලද ණය වර්ධනය සියයට 19 ක් දක්වා ප්‍රතිශත අංක 7 කින්

**1.8 රූප සටහන** **පොලී අනුපාතිකයන්හි වෙනස්වීම්**



පමණ පහත බසින ලද අතර, මෙය දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළයාමට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිඵලයකි. රජය බැංකු ක්‍රමය වෙතින් ලබාගත් ණය 2006 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, 2007 වසර තුළදී එය අයවැයගත මට්ටම තුළ පවත්වාගත හැකි විය. කෙසේ වුවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බැංකු වලින් ලබාගත් ණය ප්‍රමාණය ඉහළයාමත් සමග රාජ්‍ය සංස්ථා වලට දෙන ලද මුළු ණය ප්‍රමාණය අපේක්ෂිත මට්ටමට වඩා සැලකිය යුතු ලෙස ඉහළ යාම සිදුවිය.

**මහ බැංකුව අඛණ්ඩව සිය ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති පවත්වාගෙන ගිය ද, විවිධ කරුණු කිහිපයක් හේතුකොටගෙන උද්ධමනය මුලින් අපේක්ෂා කරන ලද මට්ටම අබිබවා ගියේය.** මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2007 මුල් භාගය තුළදී උද්ධමනය ක්‍රමයෙන් පහත දැමීමට උපකාරී විය. කෙසේ වුවද, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළයාම, 2007 ජූලි සිට ඛනිජ තෙල් සහනාධාරය මුළුමනින්ම ඉවත්කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අනෙකුත් වෙළෙඳ භාණ්ඩ වල මිල ගණන් තියුණු ලෙස ඉහළයාම හේතුවෙන්, විශේෂයෙන්ම, වසරේ දෙවන භාගය තුළදී දේශීය වෙළෙඳපොළෙහි ඇතැම් භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ ගියේය (විශේෂ සටහන 17). ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන්වලට අනුව දේශීය මිල ගණන් සංශෝධනය කිරීම නිසා දේශීය මිල ගණන් එක් වරක් පමණක් ඉහළ ගිය ද, රජයේ උද්ධමනාත්මක ණයගැනීම් තුළින් ඒ සඳහා සහනාධාර ලබා දීමේ අවශ්‍යතාවයක් ඇති නොවන බැවින් අනාගත උද්ධමනය සීමාකිරීම සඳහා මින් හිතකර බලපෑමක් ඇතිවේ.

## මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය

**විදේශීය සහ දේශීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළෙඳපොළවල්හි වැඩි පීඩනයක් පැවැති තත්ත්වයක් මධ්‍යයේ වුව ද, 2007 වසර තුල මූල්‍ය අංශය තම ශක්තිමත්භාවය හා ස්ථායීතාව පිළිබිඹු කළේය.** වඩා ශක්තිමත් කළ අධීක්ෂණ හා නියාමන රාමුවක් තුළ ලාභදායිත්වය, ප්‍රාග්ධන මට්ටම සහ වත්කම්වල ගුණාත්මක බව ඉහළයාම යනාදී අංශයන් තුළින් ප්‍රධාන මූල්‍ය ආයතන තම ශක්තිමත්භාවය තහවුරු කළ අතර, එමගින් ඔවුන් තුළ කම්පනයන්ට ඔරොත්තුදීමේ ශක්තිය සහ අවදානම් දරාගැනීමේ හැකියාව වර්ධනය විය. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ශාඛා වර්ධනයත් සමග ජනතාවට බැංකු පහසුකම් සැලසීමේ අවස්ථා 2007 වර්ෂයේ දී තවදුරටත් වර්ධනය විය. එක්සත් ජනපදයේ උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළ ගැටලුව හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළෙහි ණය කොන්දේසි දැඩිවීම සහ අවදානම් වාරික ඉහළයාම සිදුවුව ද, එයින් දේශීය මූල්‍ය ආයතනයන්ට සෘජු වශයෙන් බලපෑමක් ඇති නොවූයේ එම ආයතන වත්කම් වලින් ආවරණය වූ සුරැකුම්පත් හෝ ව්‍යුත්පන්න භාවිතාකර නොමැති බැවිනි (විශේෂ සටහන 18). මූල්‍ය පද්ධතියේ ඉදිරි දැක්ම යහපත් ආකාරයෙන් පවතින නමුත්, අයහපත් බලපෑමක් ඇතිවිය හැකි සිද්ධීන් වැළැක්වීම සඳහා පවත්නා අවදානම් පිළිබඳ සුපරීක්ෂාකාරීවීම සහ අවදානම අඩුකිරීමේ ක්‍රියාකාරකම්වල යෙදීමේ අවශ්‍යතාවය මතුවී ඇත.

**බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ශක්තිමත්භාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා හඳුන්වාදුන් මාර්ගෝපදේශ සහ ක්‍රියාමාර්ග කිහිපයක් සමගින් මූල්‍ය අංශය පාලනය කරන අධීක්ෂණ සහ නියාමන රාමුව තවදුරටත් වර්ධනය කරන ලදී.** බාසල් II ප්‍රාග්ධන අවශ්‍යතා රාමුව 2008 සිට ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු නිම කරන ලදී. එමගින් බැංකුවල අවදානම් තත්ත්වයන්ට අනුකූලව එහි ප්‍රාග්ධනය ගැලපීම සහ ණය, වෙළෙඳපොළ සහ මෙහෙයුම් අවධානම් සඳහා වඩාත් පරිපූර්ණ ප්‍රාග්ධන ආවරණයක් ලබාදෙමින් බැංකුවල තිරසාරභාවය සහ අවදානම් කළමනාකරණය ද වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුව විසින් බැංකු සඳහා සාංගමික යහ පාලනය පිළිබඳ මාර්ගෝපදේශ ද (විශේෂ සටහන 19) සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් සඳහා අනිවාර්ය ක්‍රියාපටිපාටියක් ද නිකුත් කරන ලදී. මීට අමතරව, අනුකූලතා පදනම මත සිදුවන අධීක්ෂණය වෙතින් අවදානම් පදනම මත සිදුවන අධීක්ෂණය කරා සංක්‍රමණය වීමක් දක්නට ලැබිණි. සුදුසු නියාමන සහ විචක්ෂණ සුරක්ෂිතතාවයන්ට යටත්ව, ප්‍රාථමික වෙළෙඳුන්ගේ ක්‍රියාකාරකම් විවිධාංගීකරණයට අදාළ යෝජනා සඳහා 2007 වසර තුළදී අනුමැතිය ලැබිණි.

**මූල්‍ය අංශයේ ස්ථායීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය පද්ධතියට උපකාරී වන නෛතික රාමුව ශක්තිමත් කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.** විශේෂිත කල්බදු සමාගම්වලට ණය සුරැකුම්පත් නිකුත් කිරීම මගින් මහජන අරමුදල් සපයා ගැනීමට හැකිවන ලෙස මූල්‍ය කල්බදු පනත සංශෝධනය කරනු ලැබීය. මීට අමතරව, මූල්‍ය සමාගම් නියාමනයට හා සුපරීක්ෂණයට අදාළ මහ බැංකු බලතල ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය සමාගම් පනත සංශෝධනයට අදාළ කෙටුම්පත් සකස් කරනු ලැබීය. වත්කම් වලින් ආවරණය කරන ලද සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන විශේෂිත ඒකකයක් (Special Purpose Vehicle)

**විශේෂ සටහන 1**

## මුදල් සමස්ත ඉලක්ක කිරීමේ රාමුවෙහි සිට උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුව වෙත පිවිසීම

### උද්ධමනය ඉලක්ක කිරීම පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම්

උද්ධමනය ඉලක්ක කිරීම (Inflation Targeting) යනු පෙර සැලසුම් කරන ලද කාලච්ඡේදයක් හෝ කිහිපයක් තුළදී පවත්නා ප්‍රතිපත්ති උපකරණ උපයෝගි කර ගනිමින් මහජනතාව වෙත නිවේදනය කරන ලද නිල සංඛ්‍යාත්මක උද්ධමන ඉලක්කයක් (හෝ ඉලක්ක පරාසයක් හෝ ඉහළ සීමාවක්) ළඟාකර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන මුදල් ප්‍රතිපත්ති රාමුවකි. එබැවින්, උද්ධමනය ඉලක්ක කිරීම යනු නිවේදනය කරන ලද උද්ධමන ඉලක්ක වෙතින් පුරෝකථනය කරන ලද උද්ධමන අගයන් වෙනස් වන ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් මිල ස්ථායිතා පරමාර්ථය සෘජුවම අත්කර ගැනීමට අරමුණු කරනු ලබන මුදල් ප්‍රතිපත්ති ක්‍රමෝපායයකි. සාමාන්‍යයෙන් උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුවක ප්‍රධාන ලක්ෂණ තුනක් පවතී. එනම්, (1) මැදිකාලයේ සිට දිගුකාලය දක්වා වන කාල පරාසයක් සඳහා වූ උද්ධමන ඉලක්කයක්, (2) උද්ධමන පුරෝකථනයක් සහ, (3) මෙහෙයුම් ඉලක්කයක් වශයෙනි. සාමාන්‍යයෙන් මෙහෙයුම් ඉලක්කය වශයෙන් ක්‍රියාත්මක වන්නේ කෙටිකාලීන පොලී අනුපාතිකයක් වන අතර, නිවේදනය කරනු ලබන උද්ධමන ඉලක්කය ළඟාකර ගැනීම සඳහා අන් කිසිදු නිශ්චිත අතරමැදි ඉලක්කයක් භාවිතා නොකෙරේ.

මිල ස්ථායිතාව ළඟාකර ගැනීම සඳහා උපයෝගී කරගනු ලබන විනිමය අනුපාත ඉලක්ක කිරීම, මුදල් සමස්ත ඉලක්ක කිරීම හෝ බහුදර්ශක ඉලක්ක කිරීම වැනි විවිධ මුදල් ප්‍රතිපත්ති උපාය මාර්ග අතුරින් උද්ධමනය ඉලක්ක කිරීම ලොව පුරා මුදල් අධිකාරීන් අතර බෙහෙවින් ප්‍රචලිතව ඇත. 1989 දී නවසීලන්ත සංචිත බැංකුව උද්ධමනය ඉලක්ක කිරීම සඳහා පළමු පියවර තැබීමේ සිට සංවර්ධිත රටවල් ගණනාවක්[1] සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස මෙය භාවිතයට ගෙන ඇත. මෑත වර්ෂවල නැගී එන වෙළෙඳපොළ ආර්ථික ගණනාවක්[2] ද, නිශ්චිත හා පරිපූර්ණ උද්ධමන ඉලක්ක කිරීමේ රාමුවක් අනුගමනය කිරීමට පෙළඹී ඇත. විශේෂයෙන් නැගී එන වෙළෙඳපොළ ආර්ථිකවල මේ සඳහා ඉහළ උනන්දුවක් ඇති වී ඇත්තේ පෙර දී ඉහළ උද්ධමනයක් පවතින රටවල් ලෙස සැලකූ රටවල, උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුව අනුගමනය කිරීමත් සමඟ උද්ධමනය සාර්ථකව අඩු මට්ටමක් දක්වා පැමිණීම තුළිනි. ඒ අනුව විද්වතුන්, අර්ථ ශාස්ත්‍රඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් බොහොමයක් දෙනා උද්ධමනය ඉලක්ක කිරීම සලකනු ලබන්නේ මුදල් ප්‍රතිපත්ති න්‍යාය හා පරිචය පිළිබඳ මෑතකාලීන වර්ධනයන්ට අනුකූල ලෙස රටවල මුදල් ප්‍රතිපත්තිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සාධනය තහවුරු කළ හැකි රාමුවක් වශයෙනි.

මේ වනවිට රටවල පවතින උද්ධමනය ඉලක්ක කිරීමේ වැඩ සටහන් සමාන මූල ධර්ම මත ගොඩ නංවා තිබුණත් ඒවාටම විශේෂිත වූ සහ ඒ ඒ රටවලට අනන්‍ය වූ ලක්ෂණ තිබේ. එම විශේෂතා මුදල් ප්‍රතිපත්තියේ සමස්ත අරමුණ සම්බන්ධයෙන් හෝ මෙහෙයුම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් හෝ හඳුනා ගත හැකිය. නිදසුනක් වශයෙන්, එංගලන්ත බැංකුවේ මුදල් ප්‍රතිපත්ති අරමුණ වන්නේ මිල ස්ථායිතාව පවත්වා ගැනීම වන අතර, ඊට යටත්ව වර්ධනය සහ සේවා නියුක්තිය යන රජයේ පරමාර්ථ සඳහා සහාය දැක්වීම ද වේ. තායිලන්ත බැංකුවේ ද මුදල් ප්‍රතිපත්තියෙහි ප්‍රමුඛ අරමුණ වන්නේ මිල ස්ථායිතාව පවත්වා ගැනීම වන අතර ඉන්දුනීසියානු බැංකුවේ උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුව සැලසුම් කොට ඇත්තේ උද්ධමන අනුපාතිකය සහ විනිමය අනුපාතය තුළින් නිරූපණය වන රුපියා ස්ථායිතාව ඇතිකර ගැනීම සඳහාය. ඒ අනුව, රටවල් දෙකෙහිම මහ බැංකු, විනිමය අනුපාතයේ අධික සහ අඛණ්ඩ උච්චාවචන පවතින විට එය වැළැක්වීම සඳහා මැදිහත් වේ. එසේ හෙයින්, උද්ධමන ඉලක්කය මුදල් ප්‍රතිපත්තියේ නාමික විචල්‍යය ලෙස ක්‍රියා කරනු ලබන අතර, විනිමය අනුපාතයේ නම්‍යශීලි භාවය ආර්ථිකය තුළ කම්පන සමනය කිරීමට උපකාරී වේ.

### ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉලක්ක කිරීම

වර්තමානයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කළමනාකරණ සහ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතු මුදල් සමස්ත ඉලක්ක කිරීමේ රාමුව (Monetary Targeting) මත පදනම් වේ. මෙහිදී මුදල් ගුණකය හරහා සංචිත මුදල් සමඟ සම්බන්ධ වී ඇති පුළුල් මුදල් සැපයුමේ වෙනස්වීම් මත බලපෑම් ඇති කිරීම හරහා මිල ස්ථායිතාව ළඟාකර ගැනීමට නියමිතය. එහිදී මුදල් සංසරණ ප්‍රවේගය තුළින් නිරූපණය වන මුදල් සඳහා ඇති ඉල්ලුම ස්ථාවර යැයි උපකල්පනය කෙරේ. උද්ධමනය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති රාමුවකට අනාගතයේ ගමන් කිරීමේ අරමුණ ඇතිව මුදල් ප්‍රතිපත්තියේ සහ සාර්ව ආර්ථික කළමනාකරණයෙහි ගෝලීය හා දේශීය සංවර්ධනය අනුව යමින් මුදල් සමස්ත ඉලක්ක කිරීමේ රාමුව පසුගිය කාලය පුරාම සංවර්ධනය සහ නවීකරණය කිරීම සිදුකර ඇත.

---

1. කැනඩාව (1991) , එක්සත් රාජධානිය (1992), ස්වීඩනය, පින්ලන්තය සහ ඕස්ට්‍රේලියාව (1993), ස්පාඤ්ඤය (1994), කොරියානු ජනරජය (1998), නෝර්වේ (2001)
2. මෙක්සිකෝව (1995), ඊශ්‍රායලය සහ චෙක් ජනරජය (1997 ), පෝලන්තය, බ්‍රසීලය, චිලී සහ කොලොම්බියාව (1999), දකුණු අප්‍රිකාව සහ තායිලන්තය (2000), හංගේරියාව සහ අයිස්ලන්තය (2001), පීරු සහ පිලිපීනය (2002), ඉන්දුනීසියාව (2005).

උද්ධමනය ඉලක්ක කිරීම සඳහා රටවල වැඩි උනන්දුවක් දක්වන්නේ තාක්ෂණයේ අසමසම නවෝත්පාදන සමඟ මූල්‍ය පද්ධතියේ ඇතිවන ශීඝ්‍ර දියුණුව තුළින් මුදල් සඳහා වන ඉල්ලුම් ශ්‍රිතය අස්ථායි බවක් ඇතිවීම හෝ ආර්ථිකයේ අර්බුදකාරී තත්ත්වයක් තුළින් ඇතිවන අවශ්‍යතාව මතය. එබඳු අවස්ථාවල උද්ධමන ඉලක්කයක් ඇතිකර ගැනීම සහ ඒ තුළින් ඉහළ යන උද්ධමන අපේක්ෂා මැඩ පැවැත්වීම සඳහා දැඩි කැපවීමක් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සාපේක්ෂව ඉහළ දියුණු තලයකට පත්වී නොමැති හෙයින් මුදල් සඳහා වන ඉල්ලුම තවදුරටත් ස්ථායී ලෙස පවතින්නේ වුවද, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ නව වර්ධනයන් පිළිබඳ පුළුල් සංවාදය තුළ මහබැංකුව අඛණ්ඩව නියැළී ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉලක්ක කිරීමේ හැකියාව පිළිබඳ පර්යේෂණ කටයුතු රැසක් සිදුකොට ඇති අතර, එම පර්යේෂණ ප්‍රතිඵල වාර්ෂික වාර්තා, කාලීන පත්‍රිකා සහ මාණ්ඩලික පත්‍රිකා යනාදී මහ බැංකුවේ ප්‍රකාශනවල පළකර ඇත.

උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුවක් වෙත ගමන් කිරීමේ පූර්ව අදහස සහිතව මහ බැංකුව මේ වනවිටත් පහත දැක්වෙන ආකාරයේ ක්‍රියාමාර්ග ගණනාවක් අනුගමනය කර ඇත.

1997 - උද්ධමනය ඉලක්ක කිරීම පිළිබඳ පර්යේෂණ ආරම්භ කරන ලද අතර, ඒවායේ ප්‍රතිඵල මහ බැංකුවේ මාණ්ඩලික පත්‍රිකා (1997,1999 සහ 2002) සහ වාර්ෂික වාර්තාවල (1999) පළකර ඇත.

2001 - සඵලදායි ලෙස මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් සිදු කිරීමට අදාළ පහසුකම් සැපයීම පිණිස පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී.

2002 - ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම වශයෙන් මහ බැංකුවේ අරමුණු මනා ලෙස කේන්ද්‍රගත කරන ලද අතර, පෞද්ගලික අංශයෙන් වැඩිපුර නියෝජනයක් (සාමාජිකයන් පස්දෙනාගෙන් තිදෙනෙක්) ඇති කිරීමෙන් ස්වාධීනතාව ශක්තිමත් කෙරෙන පරිදි මුදල් මණ්ඩලය පුළුල් කරන ලදී.

- මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවක් ස්ථාපනය කරන ලදී.

- පූර්ව වශයෙන් නිවේදනය කරන ලද දින දර්ශනයකට අනුව නිත්‍ය මුදල් ප්‍රතිපත්ති නිවේදන නිකුත් කිරීම ආරම්භ කරන ලදී.

2003 - සඵලදායි ලෙස මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා සක්‍රීය විවට වෙළෙඳපොළ කටයුතු ආරම්භ කරන ලදී.

2006 - පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය දියුණු කිරීම සහ මූල්‍ය වෘත්තිකයන් සඳහා ප්‍රමාණවත් පරිදි පුහුණුව සැපයීම තුළින් මහ බැංකුවේ සන්නිවේදන උපාය මාර්ගය සංවර්ධනය කරන ලදී.

2007 - මහ බැංකුවේ ප්‍රතිපත්ති, ප්‍රසිද්ධ ප්‍රකාශනයක් (ප්‍රතිපත්ති පෙර දැක්ම) තුළින් නිවේදනය කිරීම ආරම්භ කරන ලද අතර, උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුවක් යටතේ උද්ධමන වාර්තාවක් පළ කිරීම දක්වා එම කටයුතු පුළුල් කෙරෙනු ඇත.

- පෞද්ගලික අංශයේ ප්‍රවීණයන් සහ විද්වතුන්ගේ අදහස් ලබා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් පිහිටුවන ලදී.

- උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුව අනුගමනය කරන අනෙකුත් මහ බැංකුවල තාක්ෂණික සහයෝගය සහිතව මහ බැංකුව තුළ උද්ධමන පුරෝකථන ආකෘති සංවර්ධනය කරන ලදී.

- උද්ධමන පුරෝකථන සහ එම පුරෝකථනවලට අදාළ උපකල්පන ප්‍රසිද්ධ කිරීම ආරම්භ කරන ලදී.

- සුදුසු උද්ධමන දර්ශකයන් හඳුන්වා දීම සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව දිරි ගන්වන ලද අතර, එමගින් සුදුසු මූලික උද්ධමන දර්ශකයක් හා නියෝජනාත්මක දීප ව්‍යාප්ත මිල දර්ශකයක් සංවර්ධනය කිරීම සඳහා ඉඩ සැලසෙනු ඇත.

- මිල ස්ථායිතාව පවත්වා ගැනීමට අවශ්‍ය ඵලදායි ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අවශ්‍ය වන උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ ආරම්භ කරන ලදී.

- 2007 මුල් කාලයේදී ප්‍රසිද්ධ කරන ලද 2007 - 2011 කාලය සඳහා වන මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම තුළින් උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුවක් සඳහා ගමන් කිරීමේ අවශ්‍යතාව විධිමත් ලෙස පිළිගන්නා ලදී.

2008 - බොහොමයක් උද්ධමනය ඉලක්ක කරනු ලබන රටවල් මතුපිට උද්ධමනය වෙනුවට මූලික

උද්ධමනය ඉලක්ක කරනු ලබන හෙයින්, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා මූලික උද්ධමන මිනුමක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

මෙම ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගවලට අමතරව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පහසුකම් සැලසීම සඳහා අයවැය හිඟය තිරසාර මට්ටමක් දක්වා අඩුකරලීම අරමුණු කොට 2003 වසරේදී නව නෛතික ප්‍රතිපාදන [රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත] හඳුන්වා දෙන ලදී.

මුදල් සැපයුම ඉලක්ක කිරීමේ රාමුවෙහි සිට උද්ධමන ඉලක්ක කිරීමේ රාමුව වෙත පිවිසීම ක්‍රමික සහ පරීක්ෂාකාරී ක්‍රියාවලියක් ලෙස ද එය සරල පරිවර්තනයක් නොවන බව ද මහ බැංකුව කල්පනා කරයි. ඒ අනුව, මෙරටට විශේෂිත සහ ගැළපෙන පරිදි සකස් කළ උද්ධමනය ඉලක්ක කිරීමේ පරිපූර්ණ රාමුවක් මැදි කාලයේදී හඳුන්වා දීමට හැකිවන පරිදි පූර්ව අවශ්‍යතා සපුරාලීමේ ක්‍රියාවලියෙහි මහ බැංකුව විචක්ෂණශීලී ලෙස අඛණ්ඩව නියැළෙනු ඇත.

වෙත වත්කම් පැවැරීමට හැකිවන පරිදි සහ ව්‍යුහාත්මක මූල්‍ය උපකරණ නියාමනය කිරිමට හැකිවන පරිදි නව සුරැකුම්කරණ නීති (Securitisation Law) කෙටුම්පත් කර ඇත. මූල්‍ය ව්‍යුත්පන්නයන් පිළිබඳ කටයුතු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යටතට ඇතුළත් කළහැකි පරිදි එම පනත සංශෝධනය කෙරෙමින් පවතී. එමෙන්ම විචක්ෂණශීලී අධීක්ෂණය වඩාත් සවිමත් කිරීමට මෙන්ම රක්ෂණ උපකරණ බෙදාහැරීමේ නියෝජිතයන් ලෙස බැංකු හා අනිකුත් මූල්‍ය ආයතන පත්කිරීමට අවසර ලැබෙන සේ රක්ෂණ ආයතන නියාමන පනත සංශෝධනය කෙරෙමින් පවතී. විවිධ පාර්ශ්වයන්ට ණය තොරතුරු කාර්යාංශයේ සේවාවන් සැපයීමට හැකිවන පරිදි මෙන්ම අගය එකතු කළ සේවාවන් ලබාදීමට හැකිවන පරිදි ණය තොරතුරු කාර්යාංශ පනත සංශෝධනය කෙරෙමින් පවතී.

## ව්‍යුහමය ප්‍රතිපත්ති, ගැටලු සහ අභියෝග

**රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන, 2006 - 2016 දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුවෙහි දක්වා ඇති ආකාරයට, මැදිකාලීනව සියයට 8 කට වඩා වැඩි තිරසාර ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරයි.** යටිතල පහසුකම් දියුණු කිරීමත් එයට උපකාරී වන අනෙකුත් සේවාවන්වල පවත්නා අඩුපාඩු සහ සීමා පිළිබඳ ගැටලු විසඳීමත් සම්පත් වඩාත් කාර්යක්ෂමව උපයෝජනය කළහැකි පරිදි ඵලදායීතාවය විශාල ලෙස වර්ධනය කිරීමත් මගින් රටේ ධාරිතාවය පුළුල් කළයුතු බැවින් මෙය අභියෝගාත්මක කාර්යයකි. මේ සඳහා තරගකාරීව මිලකරනු ලැබූ අඛණ්ඩ බලශක්ති සැපයුම, සන්නිවේදන සේවා, පානීය සහ වාරිමාර්ග ජල සැපයුම, මහා මාර්ග, වරාය හා ගුවන් තොටුපොළ සහ සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් යනාදිය වර්ධනය කිරීමට මහා පරිමාණ ආයෝජනයන් කිරීම අවශ්‍ය වේ.

**දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුව මගින් ප්‍රකාශයට පත්කළ සැලසුම් කර ඇති ඇතැම් යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීමේදී සිදුවන මන්දගාමී ප්‍රගතිය පිළිබඳ කඩිනම් අවධානය යොමු විය යුතුය.** බලශක්ති උත්පාදනය සඳහා වන ඉහළ පිරිවැය සහ එමගින් ආර්ථිකයට වන අහිතකර බලපෑම පිළිබඳව අවධානය යොමුව ඇති බැවින් කෙරවලපිටිය, නොරොච්චෝලේ සහ ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘති වැනි බලශක්ති අංශයේ ඉතා වැදගත් ව්‍යාපෘතීන්ගේ යම් සතුටුදායක ප්‍රගතියක් ලබාගැනීමට හැකිවී ඇත. කෙසේවුවත්, කොළඹ දකුණු වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, හම්බන්තොට සාගර වරාය සංවර්ධනය කිරීම, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, කොළඹ - නුවර අධිවේගී මාර්ගය, දකුණු අධිවේගී මාර්ගය, කොළඹ පිටරවුම්පාර, වීරවිල ගුවන් තොටුපොළ වැනි අනෙකුත් මූලික ව්‍යාපෘතින්හි වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පවතී. පිරිවැය ඉහළයාම අඩුකරගැනීම සඳහා සහ මධ්‍යකාලීනව ඉහළ තිරසාර ආර්ථික වර්ධනයක් ලබාගැනීම සඳහා මෙම ව්‍යාපෘතීන් ඉතා කඩිනමින් ක්‍රියාත්මක කළයුතු වේ.

**රාජ්‍ය ණය දැරිය හැකි මට්ටමක් දක්වා පහතට ගෙන ඒමට හැකිවන ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාව වැඩිදියුණු කළයුතු වේ.** යටිතල පහසුකම් ව්‍යාපෘතීන් වෙනුවෙන් මුදල් සපයා ගැනීම සඳහා දැනට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තවදුරටත් පවත්වාගෙන යාම තුළින් අයවැය හිඟය පුළුල් වීමත් රජය විසින් ගෙවීමට ඇති ණය තවදුරටත් ඉහළ යාමත් සිදුවනු ඇත. වෙළෙඳපොළ ආර්ථිකයන්හි හා සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකයන්හි යටිතල පහසුකම් සම්බන්ධයෙන් අරමුදල් සපයා ගැනීමේදී රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාවයන්, පොදුවේ පිළිගත් ක්‍රමවේදයක් බවට පත්වෙමින් තිබේ. රජය විසින් ඉඩම්, බලපත්‍ර, ආරක්ෂාව, රාජ්‍ය සහතික සැපයීම, යනාදිය තුළින් පහසුකම් සලසමින් පෞද්ගලික අංශයට ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම සහ මෙහෙයවීම සිදුකළ හැකි පරිසරයක් නිර්මාණය කළයුතුය. මේ පදනම

මත තරඟකාරී ලංසු ක්‍රමයක් මගින් පෞද්ගලික අංශයේ සහභාගිකරුවන් තෝරාගැනීම සිදුකළහොත් සහ ඒකාධිකාරී හෝ කතිපයාධිකාරී තරඟකාරිත්වයන් තුළින් ඇතිවිය හැකි අසාධාරණ වෙළෙඳ පුරුදු වැළැක්වීමට නිසි ලෙස නියාමනය කිරීම සිදුකළහොත් රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාවයන් තුළින් වඩාත් කාර්යක්ෂම යටිතල සේවා සැපයීමට හැකියාව ලැබේ (විශේෂ සටහන 7).

**රාජ්‍ය අංශයට පීඩාවක් නොවෙමින් රාජ්‍ය ව්‍යවසායයන් මගින් වඩා කාර්යක්ෂමව සේවා සැපයීම, සාර්ව ආර්ථික ස්ථායීතාව සඳහා වන පූර්ව අවශ්‍යතාවයකි.** විදුලිය, ජලය, ප්‍රවාහන සේවා, ඛනිජ තෙල් නිෂ්පාදන සහ රජය සතු අලෙවිකරන ජාලයන් හරහා අලෙවිකරනු ලබන සේවාවන් මිලදී ගැනීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ විකිණීම වැනි සේවාවන් රාජ්‍ය ව්‍යවසායයන් මගින් සිදුකිරීම ප්‍රධාන සාර්ව ආර්ථික අසමතුලිතතා ඇතිවීමට හේතුවී ඇත. දැනට පවත්නා ව්‍යාපාර පෞද්ගලිකකරණය නොකිරීමේ ප්‍රතිපත්තීන්ට අමතරව මිහින් ලංකා, මධ්‍යම ගමනාගමන මණ්ඩලය, වී අලෙවි මණ්ඩලය හා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව සහ සමුපකාර අලෙවිකරණ ජාල වැනි රජයට අයත් ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීම හෝ නව රාජ්‍ය ආයතන ආරම්භ කිරීමෙහි නවතම ප්‍රවනතාවයක් දක්නට ඇත. මෙම රාජ්‍ය ව්‍යවසායයන් විසින් පොදු ජනතාවට තවදුරටත් පීඩනයක් නොවන පරිදි, පෞද්ගලික අංශයට වඩා තරඟකාරී හා කාර්යක්ෂමතාවයකින් යුතුව පොදු ජනතාවට සේවාවන් සැපයීම සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම නිසා, රජයේ සහනාධාර බලාපොරොත්තු නොවී වාණිජමය ශක්‍යතාවයක් සහිතව මෙහෙයුම් කටයුතු කිරීම තුළින් බලාපොරොත්තුවන අභිමතාර්ථ ළඟාකරගැනීම තහවුරු කරගැනීමට නම් එම රාජ්‍ය ව්‍යවසායයන් සඳහා මනා යහ පාලනයක් සහ මිල කිරීමේ ව්‍යුහයක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.

**රැකියා වියුක්තිය එහි වාර්තාගත අවම මට්ටම දක්වා අඩුවීමේ ප්‍රවනතාව මගින්, ඵලදායීතාවය වර්ධනය වන අයුරින් වඩා කාර්යක්ෂමව එම ශ්‍රමිකයින් සේවයේ යෙදවීම සහ ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර පවත්නා විෂමතාවන් අඩුකිරීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි.** මෑත කාලීනව, ඉහළ ආර්ථික වර්ධනයට වැඩි දායකත්වයක් සපයා ඇති විශේෂයෙන්ම, කාර්මික හා සේවා අංශයන්හි ශ්‍රම ඵලදායීතාවය පසුගිය වසර ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පැවැතීම දක්නට ලැබීම දිරිගන්වන සුළු කරුණකි. කෙසේ වුවද, ශ්‍රම සැපයුමෙහි හා ශ්‍රම ඉල්ලුමෙහි ඇති අසමතුලිතතාව පෙන්නුම් කරනු ලබන කරුණු වන්නේ ඉහළ තරුණ සේවා වියුක්තිය, උපාධිධාරින්ගේ සේවා වියුක්තිය, ඔවුන් දැනටමත් පුළුල්ව ඇති රාජ්‍ය අංශයට බැඳීමට ඇති කැමැත්ත හා පෞද්ගලික අංශයට සුදුසු දක්ෂ සේවකයින් සොයාගැනීමේ අපහසුතාවය යනාදියයි. මේ අතර, කෘෂිකාර්මික අංශයෙහි සේවා නියුක්තිය අඩුවෙමින් පවතින තත්ත්වයක් තුළ කෘෂිකාර්මික අංශයෙන් අපේක්ෂිත වර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සහ වඩාත් සමබර කලාපීය වර්ධනයක් ඇතිකර ගැනීමට පූර්ව අවශ්‍යතාවයක් වන්නේ කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීමයි.

**සාක්ෂරතාවය, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය යනාදිය අතින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශයේ දියුණුව සංවර්ධිත රටවල් වලට සමාන මට්ටමක පැවැතුණ ද, ලංකාවේ තෘතීය අධ්‍යාපනය, විශේෂයෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සමාන කලාපීය රටවල්වල තත්ත්වයට වඩා පහත් මට්ටමක පවතී.** ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රවේශය ඉතා තරඟකාරී වන අතර, වසරකට විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන සංඛ්‍යාවෙන් රජයේ විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශය ලැබෙන්නේ සියයට 15 වැනි අඩු ප්‍රතිශතයකට පමණි. සිසුන්ගෙන් දක්ෂතම මෙම සියයට 15 ට වුවද මුහුණ පාන්නට සිදුවන්නේ සැපයුම මත රැඳුණු විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමයකට නිසා ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට සහ ව්‍යවසායකත්ව සංස්කෘතියට එයින් ලැබෙන්නේ සුළු පිටුවහලක් වන බැවින් එමගින් ශ්‍රම සැපයුම හා ඉල්ලුම අතර නොගැළපීමක් ඇතිකරයි. විශ්ව විද්‍යාලවලට ඇතුළත්වන සිසුන්ගෙන් සියයට 65 පමණ සිසුන් සමාජ හා මානව විද්‍යා අංශයේ විෂයයන් හදාරන නිසා ඔවුන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවකට ඵලදායී රැකියා සොයාගැනීම අපහසු වේ. ඔවුන් දිගුකාලයක් සේවා වියුක්තව හෝ ඌන සේවා නියුක්තියක් සහිතව සිටින බැවින් ඔවුන් අතර අසහනයන් ඇති වී සමාජ ප්‍රශ්න ද ඇතිවේ. මූල්‍ය හා සම්පත් හිඟකම් ද රජයේ විශ්ව විද්‍යාල ක්‍රමයේ ප්‍රගතිය සීමාකරන අතර, එමගින් එම අංශයට විකල්ප මූල්‍යන ක්‍රම ඇතිකිරීමේ වැදගත්කම පෙන්වා දෙයි. එම නිසා, සියලුදෙනාටම වඩාත් ගැලපෙන උසස් අධ්‍යාපනයක් ලබාදීමට හා ශ්‍රම සැපයුමේ හා ඉල්ලුමේ නොගැළපීම් පිළිබඳ ගැටලු නිරාකරණය කිරීමට හැකිවන ලෙස උසස් අධ්‍යාපනයට ප්‍රතිසංස්කරණ ගෙන ඒම අත්‍යවශ්‍ය කරුණකි (විශේෂ සටහන 8).

## 1.3 විදේශීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

**රටවල් කිහිපයක් 2007 වසර ප්‍රථම භාගය තුළදී දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන් අනුගමනය කළ ද, ලෝක ආර්ථිකය 2007 වසරේදී නොකඩවා 5 වැනි වසරටත් සියයට 4 කට වඩා වැඩි වර්ධනයක් අත්කර ගත්තේය.** වසරේ දෙවන භාගය තුළදී ජාත්‍යන්තර ඛනිජ

**1.4 සංඛ්‍යා සටහන**

**ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම**
(වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස)

| ශීර්ෂය | ප්‍රත්‍යක්ෂ අගයන් | | පුරෝකථන | |
|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007 | 2008 |
| **ලෝක නිෂ්පාදිතය** | **4.4** | **5.0** | **4.9** | **4.1** |
| සංවර්ධිත ආර්ථිකයන් | 2.5 | 3.0 | 2.6 | 1.8 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 3.1 | 2.9 | 2.2 | 1.5 |
| යුරෝ කලාපය | 1.5 | 2.8 | 2.6 | 1.6 |
| එක්සත් රාජධානිය | 1.8 | 2.8 | 3.1 | 2.3 |
| ජපානය | 1.9 | 2.4 | 1.9 | 1.5 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 7.0 | 7.7 | 7.8 | 6.9 |
| සංවර්ධනය වන ආසියාව | 9.0 | 9.6 | 9.6 | 8.6 |
| චීනය | 10.4 | 11.1 | 11.4 | 10.0 |
| ඉන්දියාව | 9.0 | 9.7 | 8.9 | 8.4 |
| **ලෝක වෙළෙඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **7.5** | **9.2** | **6.6** | **6.7** |
| ආනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 6.1 | 7.4 | 4.3 | 5.0 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 12.1 | 14.9 | 12.5 | 11.3 |
| අපනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 5.8 | 8.2 | 5.4 | 5.3 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 11.1 | 11.0 | 9.2 | 9.0 |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 2.3 | 2.3 | 2.1 | 2.0 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 5.2 | 5.1 | 5.9 | 5.3 |
| භාණ්ඩ මිල (එ.ජ. ඩොලර්) | | | | |
| ඉන්ධන | 41.3 | 20.5 | 6.6 | 9.5 |
| ඉන්ධන නොවන | 10.3 | 28.4 | 12.2 | -6.7 |
| **එ.ජ. ඩොලර් තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය (සියයට)** | **3.8** | **5.4** | **5.4** | **5.5** |

මූලය: World Economic Outlook (2008 ජනවාරි සහ 2007 ඔක්තෝබර්) ජා.මූ.අ.

තෙල් ඇතුළු වෙළෙඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යාම සහ එක්සත් ජනපදයේ හටගත් උප - ප්‍රාථමික උකස් වෙළෙඳපොළ අර්බුදය නිසා ඇතිවූ මූල්‍ය වෙළෙඳපොළ කැළඹිලි සහිත තත්ත්වය වර්ධන ප්‍රවනතාවයට බාධාකාරී තත්ත්වයක් ඇතිකරන ලදී. 2007, පළමු කාර්තු තුන තුළදී යහපත් අනුපාතිකයකින් වර්ධනය වූ ලෝක ආර්ථිකය, මූල්‍ය වෙළෙඳපොළ කැළඹිලි සහිත තත්ත්වය නිසා අවසාන කාර්තුවේදී පසුබෑමට ලක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කරනු ලබන ලෝක ආර්ථික දැක්ම (World Economic Outlook) 2008 ජනවාරි කලාපයට අනුව, 2006 වාර්තා වූ සියයට 5 ක වර්ධනයට සාපේක්ෂව, ලෝක ආර්ථිකය 2007 වසරේදී සියයට 4.9 ක වර්ධනයක් වාර්තා කරන්නට ඇතැයි ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත සහ නිවාස සංවර්ධන අංශයන්හි කටයුතු දුර්වලවීම නිසා 2007 වසරේ අවසාන කාර්තුවේදී එක්සත් ජනපද ආර්ථික වර්ධනය විශාල ලෙස මන්දගාමී තත්ත්වයට පත් විය. කෙසේ වුවත්, චීනය, ඉන්දියාව, රුසියාව හා බ්‍රසීලය වැනි රටවල වේගවත් ආර්ථික වර්ධනය, එක්සත් ජනපද ආර්ථිකයේ ඇති වූ සාමාන්‍ය වර්ධනය අභිභවා ගිය අතර, එම රටවල් සමස්තයක් ලෙස ගත්විට ලෝක ආර්ථික වර්ධනයෙන් අඩකටත් වැඩි දායකත්වයක් ලබා දුන්නේය. අනෙකුත් දියුණු වෙමින් පවතින හා නැගී එන රටවල් විසින් ද ශක්තිමත් වර්ධනයක් පවත්වා ගන්නා ලදී. "යුරෝ" මුදල ශක්තිමත් වීම හා එක්සත් ජනපද ආර්ථිකයේ සිදු වූ මන්දගාමී තත්ත්වය, යුරෝ කලාපීය ආර්ථික වර්ධනය ද මන්දගාමී වීමට තරමක් දුරට බලපෑවේය. ගොඩනැගිලි ප්‍රමිතීන් දැඩි කිරීම නිසා ඉදි කිරීම් අංශයේ පසුබෑම ලෝක ආර්ථික වර්ධනයේ අඩුවීම සහ ජපාන "යෙන්" සාපේක්ෂ වශයෙන් ශක්තිමත් වීම නිසා ජපාන ආර්ථික වර්ධනය අඩු වී ඇත.

**එක්සත් ජනපදයේ උප-ප්‍රාථමික නිවාස උකස් වෙළෙඳපොළේ ඇති වූ ණය ගෙවීම් පැහැර හැරීම් හේතුකොටගෙන එම වෙළෙඳපොළේ ඇති වූ අර්බුද සමඟ ලෝක මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන්හි ද ඉහළ උච්චාවචනයක් දක්නට ලැබිණි** (විශේෂ සටහන 18). දියුණු රටවල මහ බැංකු කිහිපයක් විසින් පොලී අනුපාතික අඩු කිරීම සහ ද්‍රවශීලතාව සැපයීම යනාදී ස්වරූපයෙන් ගනු ලැබූ සාමූහික ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් වශයෙන් අන්තර් බැංකු වෙළෙඳපොළවල්හි ද්‍රවශීලතා හිඟය අඩු කිරීමට හැකි විය. නැගී එන වෙළෙඳපොළවල් මෙම තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දී ඇති අතර, ඒ සඳහා එම රටවල ආර්ථික වර්ධනය සහ යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයන් තුළින් එම රටවලට විශාල ලෙස විදේශ ප්‍රාග්ධනය ගලා ඒම හේතු වී ඇත. එහෙත් ඇතැම් නැගී එන ආර්ථිකයන්හි මෑතකදී සිදු වූ කොටස් මිල ගණන් පහත වැටීම් මගින් එම ආර්ථිකයන්හට මෙම අර්බුදය හේතුවෙන් වූ බලපෑමෙන් වැළකීමට නොහැකි වූ බව පෙනී යයි.

**උද්ධමනාත්මක පීඩන මැඩ පැවැත්වීමට බොහෝ රටවල් දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග අනුගමනය කරමින් සිටි නිසා, උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළේ ඇති වූ අර්බුදයට පෙර කෙටිකාලීන පොලී අනුපාතිකයන් ඉහළ ගොස් තිබුණි.** වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවය හා ඉහළ යමින් පැවති වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් නිසා ඇති වූ උද්ධමනකාරී පීඩනය මැඩ පැවැත්වීමට 2007 ජුලි මාසය වනතෙක්, බොහෝ මහ බැංකු තම පොලී අනුපාතික ඉහළ දැමූ අතර, එමගින් කෙටිකාලීන පොලී අනුපාතිකයන්හි වැඩි වීමක් දක්නට ලැබුණි. ජීව ඉන්ධන නිපදවීම සඳහා තිරිඟු හා අනිකුත් ආහාර ද්‍රව්‍යයන් භාවිතය වැඩිවීම සහ රටවල් ගණනාවක පැවති අයහපත් කාලගුණ තත්ත්වයන් නිසා සැපයුමට සිදු වූ බාධාවන් හේතුවෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිල ගණන් අසාමාන්‍ය ලෙස ඉහළ ගියේය.

කෙසේ නමුත්, 2007 ජූලි මාසයේ සිට ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළේ ඇති වූ කැළඹිලි ස්වභාවයත් සමග එක් දින පොලී අනුපාතික ස්ථායී කිරීම සඳහා දියුණු රටවල මහ බැංකු විවට වෙළෙඳපොළ කටයුතු තුළින් විශාල වශයෙන් ආර්ථිකයට ද්‍රවශීලතාවය මුදාහරින ලදී. මේ අතර, ජපානය, ඕස්ට්‍රේලියාව, කොරියාව, චීනය, චිලී රාජ්‍යය, මෙක්සිකෝව සහ යූරෝ කලාපීය රටවල් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දමා ඇත. ලෝක මූල්‍ය වෙළෙඳපොළේ ඇති වූ කැළඹිලි සහිත ස්වභාවය නිසා අවිනිශ්චිතතාවයන් වැඩි වී ඇති අතර, විශේෂයෙන්ම දියුණු වෙමින් පවතින හා නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට එය දැඩි අභියෝගයක් වී ඇත.

**ප්‍රධාන මුදල් වර්ගවල 2006 දී පැවති උපනතියම මෙම වසරේදීත් බොහෝදුරට දක්නට ලැබුණි.** එක්සත් ජනපද ආර්ථික වර්ධනය මන්දගාමී වීම සහ ජංගම ගිණුමේ හිඟය පුළුල්වීම හේතුවෙන් 2007 වසර තුළදී එක්සත් ජනපද ඩොලරය අනෙකුත් ප්‍රධාන මුදල් වර්ග වලට එරෙහිව තවදුරටත් දුර්වල විය. 2007 වසර තුළදී එ.ජ.ඩොලරය යූරෝවලට හා ඉන්දියානු රුපියලට එරෙහිව ඉහළ අගයකින් අවප්‍රමාණය වූ අතර, එක්සත් රාජධානි ස්ටර්ලින් පවුමට හා ජපන් යෙන්වලට එරෙහිව සුළු වශයෙන් අවප්‍රමාණය විය. ජංගම ගිණුමේ ඉහළ අතිරික්තය සහ විදේශ මූල්‍ය ප්‍රවාහ ලැබීම් වැඩිවීම නිසා චීනයේ විදේශ සංචිත ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස චීනයේ රෙන්මින්බි එක්සත් ජනපද ඩොලරයට එරෙහිව තවදුරටත් අඛණ්ඩව අධි ප්‍රමාණය විය. ඉන්දියාවේ ඉහළ ආර්ථික වර්ධනය හා විවිධ ආයෝජන තුළින් සිදු වූ ප්‍රාග්ධන ගලා ඒම් ඉන්දියානු රුපියල එක්සත් ජනපද ඩොලරයට එරෙහිව අධි ප්‍රමාණවීමට හේතු විය. අනෙකුත් දියුණු රටවල් සමග සැසඳීමේදී යූරෝ කලාපීය රටවල සාපේක්ෂ වශයෙන් වාර්තා වූ අඩු උද්ධමනය හා ආර්ථික වර්ධනයට ඇති වූ අයහපත් බලපෑම අඩු මට්ටමක පැවතීම යූරෝ ශක්තිමත් වීමට හේතු විය.

**2008 වසරේ ලෝක ආර්ථිකය සියයට 4-4.25 කින් වර්ධනය වෙතැයි පුරෝකථනය කර ඇති අතර, එය අඛණ්ඩව හය වන වරටත් සියයට 4 ට වඩා වැඩි නමුදු 2007 වසරේදී වාර්තා කළ සියයට 4.9 ට වඩා අඩු අගයකි.** ගෝලීය ආර්ථික වර්ධනය අඩුවීමට හේතු වනු ඇත්තේ ඇමෙරිකාවේ උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළේ ඇති වූ ගැටලු සහගත තත්ත්වය නිසා දියුණු ආර්ථිකයන්හි මූල්‍ය වෙළෙඳපොළ මුහුණ දුන් අර්බුදකාරී තත්ත්වයත් එමගින් නැගී එන ආර්ථිකයන් වෙත විදේශීය මූල්‍ය ප්‍රවාහ ලැබීම්වල අඩුවීමක් ඇතිවීමට බලපෑමක් සිදු වියහැකි වීමත්ය. දියුණු ආර්ථිකයන් 2007 වසරේදී වාර්තා කළ සියයට 2.6 ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව එම රටවල 2008 වසරේ වර්ධනය සියයට 1.8 ක පමණ අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගැනුම්කරුවන් වන එක්සත් ජනපදය හා යූරෝ කලාප තුළ 2007 වසරේදී ඇස්තමේන්තුගත වර්ධනය වූ පිළිවෙලින් සියයට 2.2 හා සියයට 2.6 ට සාපේක්ෂව, 2008 වසර සඳහා පිළිවෙලින් සියයට 1.5 ක හා සියයට 1.6 ක අඩු වර්ධනයක් ඇස්තමේන්තු කර ඇත. නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් හා දියුණු වෙමින් පවතින ආර්ථිකයන් 2007 දී වාර්තා කළ සියයට 7.8 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසර සඳහා සියයට 6.9 ක මධ්‍යස්ථ වර්ධනයක් අත්කර ගනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. විදේශ ප්‍රාග්ධන ප්‍රවාහයන් මත යැපෙන නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි වර්ධනයට, ලෝක ණය වෙළෙඳපොළෙහි අර්බුදකාරී තත්ත්වය සහ ද්‍රවශීලතා සංකෝචනය අහිතකර ලෙස බලපෑ හැකිය. කෙසේ වෙතත්, ශීඝ්‍රයෙන් වර්ධනය වන දේශීය ඉල්ලුම සහ මනා සංයමයකින් යුත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගවලින් මෙම ආර්ථිකයන් ප්‍රතිලාභ ලබනු ඇත. ඉහළ බලශක්ති හා ආහාර ද්‍රව්‍ය මිල ගණන් තුළින් වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කරනු ලබන ආර්ථිකයන්ට වාසිදායක තත්ත්වයක් අත්වනු ඇත. උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළ අර්බුදය, අනෙකුත් රටවලට පැතිරීමේ අවදානම නිසා ලෝක ආර්ථික වර්ධන පුරෝකථනයන් තවදුරටත් අවාසිදායක අතට හැරීමේ අවදානමක් ඇත. එක්සත් ජනපද ආර්ථිකයේ මන්දගාමීත්වයක් හෝ ආර්ථික අවපාතයක් ඇතිවීම වැළැක්වීමට එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් තම ප්‍රතිපත්ති පොලී අනුපාතික විශාල වශයෙන් පහළ දැමූ අතර, එක්සත් ජනපද රජය විසින් පරිභෝජනය හා ආයෝජනය වැඩි දියුණු කිරීම දිරිගන්වන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දී ඇත.

**ජාත්‍යන්තර වෙළෙඳ ද්‍රව්‍ය මිල ඉහළයාම, නිමැවුම් පරතරය (Output Gap) අඩුවීම සහ සමහර දියුණු ආර්ථිකයන්, තම ආර්ථිකයන්හි ඇති වූ පසුබෑස්මට හා උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළ ආශ්‍රිතව හටගත් ද්‍රවශීලතා හිඟ වලින් වූ බලපෑමට මුහුණ දීමට අනුග මනය කළ ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති නිසා ගෝලීය උද්ධමනය තවදුරටත් 2008 වසරේදී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඉහළ යමින් පවතින ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල ගෝලීය උද්ධමනය ඉහළ යාමට ප්‍රධාන සාධක වී ඇත. මෙය විශේෂයෙන්, තම පරිභෝජන පැසෙහි සියයට 35-40 ක් පමණ ආහාර ද්‍රව්‍ය ලෙස පවත්නා නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි හා සංවර්ධනය වෙමින් පවතින රටවල්වල උද්ධමනය ඉහළ යාමට හේතු වී ඇත (විශේෂ සටහන17).


**විශේෂ සටහන 2**

## නැගෙනහිර පළාතේ සංවර්ධනය : විභවතාවයන් හා උපාය මාර්ගයන්

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්කවලින් සමන්විත වේ. එය කෙත්වතු, වනාන්තර, ලඳුකැලෑ, තෙත්බිම්, සුන්දර මුහුදු කළපු හා වෙරළ තීරයන් වැනි සම්පත්වලින් පරිපූර්ණ පළාතක් වේ[1]. එසේම, ලෝකයේ විශාලතම ස්වභාවික වරායන් ගෙන් එකක් මේ ප්‍රදේශයේ පවතී. කෙසේ වෙතත්, පසුගිය දශක දෙකහමාරක පමණ කාලයක් මුළුල්ලෙහි පැවති අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් ආර්ථික සංවර්ධනය අතින් පසුබෑමකට ලක්වී ඇති අතර, 2002 - 2006 කාලසීමාව තුළ නැගෙනහිර පළාතේ ආර්ථික වර්ධන වේගය සියයට 5 ක් පමණ විය[2]. නැගෙනහිර පළාත රටෙහි මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 15 ක් හා මුළු ජනගහනයෙන් සියයට 7.9 ක් පමණ ජීවත්වන ප්‍රදේශයක් වුවද, දිළිඳු හා අඩු සංවර්ධනයක් සහිත ප්‍රදේශයක් වන

**වි.ස. 2.1.**
**රූප සටහන**

**නැගෙනහිර පළාතේ සිතියම**




මූලය: තුන් අවුරුදු නැගෙනහිර පළාත් සංවර්ධන සැලසුම : 2007-2010,
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, 2007 නොවැම්බර්.

---

1. නැගෙනහිර පළාතේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 9,361 ක් වන අතර, එය රටේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 15 ක් පමණ වේ. එහි ඇති කෘෂිකාර්මික භූමි ප්‍රමාණය හෙක්ටයාර් 450,450, රටේ මුළු කෘෂිකාර්මික බිම් ප්‍රමාණයෙන් සියයට 26 ක් පමණ වේ. පළාතේ ජනගහනය දශ ලක්ෂ 1.6 ක් පමණ වන අතර එය රටේ මුළු ජනගහනයෙන් සියයට 7.9 ක් පමණ වේ. 2006 දී නැගෙනහිර පළාතේ ද.දේ.නි. යෙන් සියයට 50 කට සේවා අංශය දායක වූ අතර කෘෂිකාර්මික හා කාර්මික අංශ පිළිවෙළින් සියයට 23 කින් හා සියයට 27 කින් දායක විය.
2. ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2007.

**සංඛ්‍යා සටහන වි.ස. 2. 1**

**නැගෙනහිර පළාත තුළ ප්‍රධාන අංශ /වැඩසටහන් සඳහා වන ආයෝජන සැළසුමේ සාරාංශය**

රුපියල් බිලියන

| අංශය | 2007 | 2008 | 2009 | 2010 | මුළු ආයෝජන | මුළු ආයෝජනයේ ප්‍රතිශතය ලෙස |
|---|---|---|---|---|---|---|
| 1. නැවත පැමිණෙන පුද්ගලයන් පදිංචි කරවීම | 3.7 | 4.8 | 6.0 | 7.0 | 21.5 | 10.8 |
| 2. ඵලදායී අංශයන් සහ ප්‍රාදේශීය ආර්ථිකය නැවත නගා සිටුවීම | 2.1 | 8.7 | 10.9 | 12.2 | 33.9 | 17.1 |
| 3. ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | 11.8 | 21.3 | 25.8 | 24.9 | 83.8 | 42.2 |
| 4. සමාජ සේවා වැඩි දියුණු කිරීම හා සමාජ යටිතල පහසුකම් පුළුල් කිරීම | 2.0 | 6.4 | 5.3 | 5.4 | 19.1 | 9.6 |
| 5. ජනාවාස සංවර්ධනය කිරීම | 6.5 | 9.3 | 11.1 | 11.1 | 38.0 | 19.1 |
| 6. රාජ්‍ය ආයතනවල ශක්‍යතා වර්ධනය | 0.5 | 0.5 | 0.6 | 0.6 | 2.2 | 1.2 |
| **එකතුව** | 26.6 | 51.0 | 59.7 | 61.2 | 198.5 | 100.0 |

මූලය: තුන් අවුරුදු නැගෙනහිර පළාත් සංවර්ධන සැලසුම : 2007 - 2010,
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, නොවැම්බර් 2007

හෙයින් ද.දේ.නි. සඳහා වන දායකත්වය සියයට 4.7 ක ප්‍රමාණය ඉතාම පහළ මට්ටමක පවතී. 2007 වසර අවසානය වන විට, ත්‍රස්තවාදී කණ්ඩායම් යටතේ පැවති ප්‍රදේශ රජය විසින් අත්පත් කරගනිමින් එම පළාත් වාසීන්ට තම ජීවන කටයුතු නැවත ආරම්භ කිරීමට සුදුසු වාතාවරණයක් ඇති කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර පළාත අතහැර ගිය පුද්ගලයන්, විශාල ප්‍රමාණයක් නැවත තම ගම්බිම් කරා පැමිණි බව වාර්තා වේ[3].

පවත්නා සම්පත් නිසිපරිදි භාවිතා කළහොත් නැගෙනහිර පළාත තුළ පවත්නා විශාල විභවතාවය ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාදිය හැකි නව ප්‍රභවයක් බවට පත්කළ හැකිවනු ඇත. විශේෂයෙන් කෘෂිකාර්මික, ධීවර, වන සම්පත් සහ පතල් යන ක්ෂේත්‍රවලින් ආර්ථික වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබාදීමට හැකියාවක් පවතින අතර එමගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට හැකිවනු ඇත.

සම්පත් වලින් ගහණ නැගෙනහිර පළාතේ මෙම විභවතාවයන් ක්ෂේත්‍ර කිහිපයකට ගොනු කළ හැකිය. පළමුව සහ ප්‍රධානතම වශයෙන්, දකුණු ආසියාවේ ප්‍රධාන වෙළෙඳ හා කර්මාන්ත මධ්‍යස්ථානයක් බවට පත්වීමට හැකිවන ලෙස ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කිරීමට හැකියාව ඇත. කිලෝමීටර් 436 ක් පමණ පුළුල්ව පැතිරී ඇති සුන්දර වෙරළ තීරයන් හා පාරිසරික සංරක්ෂණ ප්‍රදේශ යනාදිය වඩාත් ශක්තිමත් සංචාරක කර්මාන්තයක් සඳහා උපකාරී කරගත හැකිය. දිගු ප්‍රදේශයක් පුරා විහිදෙන මුහුදු තීරය ධීවර සම්පත් සංවර්ධනය කිරීම සඳහා වන ඉඩ ප්‍රස්තාවන් පෙන්නුම් කරයි. ඉතා සාරවත් පස, ඊසානදිග මෝසම් මගින් නිසිලෙස ලැබෙන වර්ෂාපතනය සහ අඩු ජනගහණ ඝණත්වයක් සහිත ප්‍රදේශ යනාදිය හේතුවෙන් නැගෙනහිර පළාත කෘෂිකාර්මික කටයුතු සඳහා ඉතා සුදුසු ප්‍රදේශයක් වේ.

මීට සමගාමීව, පළාතේ යටිතල පහසුකම් සහ අනෙකුත් උපකාරී සේවාවන් වැඩිදියුණු කිරීම මගින් තිරසාර ආර්ථික උන්නතියක් ඇතිකර ගැනීම අරමුණු කරගෙන, රජය විසින් *"තුන් අවුරුදු නැගෙනහිර පළාත් සංවර්ධන සැලසුම: 2007-2010"(නැගෙනහිරනවෝදය)* හඳුන්වාදෙන ලදී. පළාතේ ජනතාවගේ ජීවනෝපායයන් යථා තත්ත්වයට පත්කිරීමට පෙර පළාතේ ඔවුන්ගේ මූලික අයිතීන් ඉතා කඩිනමින් ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ආරක්ෂාව සහතික කිරීම මෙම සැලසුමෙන් ආවරණය කෙරේ. ඉදිරි වසර තුන තුළ දී, ආර්ථික යටිතල පහසුකම්, මානව හා ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීම තුළින් කෘෂිකාර්මික, ධීවර, කර්මාන්ත සහ සංචාරක යන අංශයන් සංවර්ධනය කිරීම ද නැගෙනහිර නවෝදය වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ.

සංඛ්‍යා සටහන වි.ස. 2.1 හි දක්වා ඇති පරිදි 2007 දී වෙන්කරන ලද රුපියල් බිලියන 26.6 ද ඇතුළත්ව නැගෙනහිර නවෝදය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 198.5 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ආර්ථික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් බිලියන 83.8 ක් වන ඉහළම මුදලක් වෙන්කරනු ලැබ ඇති අතර, ප්‍රාදේශීය ආර්ථිකයන් හා ඵලදායී අංශයන් නැවත

3. එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තා වලට අනුව 2008 ජනවාරි අගවන විට නැගෙනහිර පළාතේ අවතැන්වූවන්ගෙන් නැවත පැමිණි සංඛ්‍යාව 170,763 කි.

නගාසිටුවීම සඳහා රුපියල් බිලියන 33.9 ක මුදලක් වෙන් කෙරේ. ජනාවාස සංවර්ධනය හා අවතැන් වූවන් නැවත පදිංචිකරවීම සඳහා රුපියල් බිලියන 59.5 ක මුදලක් වෙන්කරනු ඇත. නැගෙනහිර නවෝදය වැඩසටහන සඳහා වන වියදම් මූල්‍යයනය කරනු ලබන මූලාශ්‍ර දෙස බලන කල, මුළු ආයෝජනවලින් සියයට 52 ක ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරය විසින් විදේශීය මූලාශ්‍රවලින් සපයනු ලබන අතර, සියයට 30 ක මුදලක් මහා භාණ්ඩාගාරය තම අරමුදල්වලින් සෘජුවම ලබාදෙනු ඇත. ඉතිරි සියයට 18 ක මුදල පෞද්ගලික අංශයෙන් හා රාජ්‍ය නොවන සංවිධානවල ආයෝජන හරහා ලබාගැනීමට අපේක්ෂිතය.

සිවිල් පරිපාලනය නගාසිටුවීම සඳහා සහ අනෙකුත් සේවා සැපයීම සඳහා ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය විසින් 2007 දෙසැම්බර් අවසානය වන විට නිමකළ දින 180 වැඩසටහන යනාදිය නැගෙනහිර පළාත තුළ සිදු කරනු ලබන කෙටිකාලීන වැඩසටහන් වලට ඇතුළත් වේ. වගාකටයුතු ආරම්භ කිරීමට අවසර ලබාදීම සඳහා බිම්බෝම්බ ඉවත් කිරීම, මාර්ග සම්බන්ධතා යථා තත්ත්වයට පත්කිරීම සහ නැවත පැමිණෙන්නන් පදිංචි කරවීම සඳහා ජල සැපයුම හා සනීපාරක්ෂක සේවා සහ විදුලිබලය, වැනි මූලික අවශ්‍යතාවයන් සැපයීම මෙන්ම පොලිස් ස්ථාන, ආරෝග්‍යශාලා සහ සිවිල් පරිපාලනය පිහිටුවීම යනාදිය මෙම වැඩසටහනට ඇතුළත් විය.

නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ කර්මාන්ත සංවර්ධනය පිළිබඳව සලකා බලන විට, රජය දැනටමත් නැගෙනහිර පළාතේ ආයෝජන දිරිගැන්වීම සඳහා සහන ගණනාවක් හඳුන්වා දී ඇත. 2008 අයවැය මගින්, නැගෙනහිර පළාතේ රුපියල් දශ ලක්ෂ 50 කට වඩා වැඩි හා පුද්ගලයන් 50 කට වඩා වැඩි ප්‍රමාණයකට රැකියා අවස්ථාවන් සපයනු ලබන ආයෝජන සඳහා නව බදු සහන ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එවැනි ආයෝජන මගින් උපයනු ලබන ලාභ හා ආදායම් වසර 3 ක කාලයක් සඳහා ආදායම් බදුවලින් නිදහස් කරනු ඇත. එහි දී (අ) අදාළ නව ව්‍යාපෘතිය ලාභ ඉපයීමට පටන් ගන්නා තක්සේරු වර්ෂය හෝ (ආ) එය වාණිජමය කටයුතු ආරම්භයේ සිට වසර 3 ක කාලයක් සම්පූර්ණ කරනු ලබන තක්සේරු වර්ෂය යන දෙකෙන් පළමුව සිදුවන දෙය යන කොන්දේසිය අදාළ වේ. මීට අමතරව, නැගෙනහිර පළාතේ පිහිටුවනු ලබන නව ව්‍යාපෘතිවල භාවිතය සඳහා කලින් හඳුනාගත් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ආනයන තීරුබදු අත්හැරීම් හා එකතුකළ අගය මත බදු නිදහස් කිරීම් සඳහා හිමිකම් ලබයි.

ආර්ථිකයේ ඵලදායී අංශයන් නැවත නගාසිටුවීම මගින් ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමත් නැගෙනහිර නවෝදය මගින් අපේක්ෂා කෙරේ. ඵලදායිතාවය ඉහළ නැංවීම, නිමැවුම් වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා වෙළෙඳපොළට පිවිසීමට ඇති හැකියාව වැඩිකිරීම හරහා කෘෂිකාර්මික බෝගවගාව, වාරිමාර්ග, ධීවර හා පශු සම්පත් යන අංශවල නිෂ්පාදනය, සැකසීම හා අගය එකතු කිරීම යන අංශවල ආයෝජන දිරිගැන්වීම යනාදියද මෙම වැඩසටහනට ඇතුලත් වේ. කාර්මික සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමට කාර්මික කළාප හා ගම්මාන පිහිටුවීමට ද රජය අපේක්ෂා කරයි. වෙරළ තීරයේ තිබෙන සංචාරක නිකේතන පුනරුත්ථාපනය කිරීම මගින් දේශීය හා විදේශීය සංචාරක අංශ සංවර්ධනය කිරීම සඳහාවන උපාය මාර්ග නැගෙනහිර නවෝදය තුළ ඇතුළත් වේ.

කලාපය තුළ ආර්ථික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ව්‍යාපෘති ද ක්‍රියාත්මක කරනු ඇත. බලශක්ති අංශයෙන් බලන කල, ජාතික විදුලිබල පද්ධතියෙන් ලබන විදුලිබල පහසුකම් ඇත්තේ කුටුම්භයන්ගෙන් සියයට 58 කට පමණි. එබැවින්, විදුලිබල උත්පාදනය වැඩිකිරීම සඳහා මෙගාවොට් 500 ක ධාරිතාවයෙන් යුතු ගල්අඟුරු බලාගාරයක් ත්‍රිකුණාමලයේ ඉදිකිරීමට නැගෙනහිර නවෝදය යටතේ අපේක්ෂා කෙරේ. තවද, යෝජනා ක්‍රම 300 කට ආසන්න ප්‍රමාණයක් මගින් නැගෙනහිර පළාතේ ගම්මානවලට විදුලිය ලබාදීම සඳහා ග්‍රාමීය විදුලිබල මධ්‍යස්ථානවල දැනට පවතින පරිපථ වැඩිදියුණු කිරීම හා ග්‍රාමීය විදුලිබල මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම සඳහා උප මධ්‍යස්ථාන හා සම්ප්‍රේෂණ මාර්ග ගණනාවක් ඉදිකිරීමට ද අපේක්ෂා කෙරේ. මහාමාර්ග සම්බන්ධයෙන් සලකා බලන විට දැනට තිබෙන මාර්ග හා පාලම් පද්ධතිය හා යෝජිත නව මාර්ග හා පාලම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති 17 ක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. එමගින් පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම, ප්‍රවාහනය සඳහා යන වියදම් අඩුකිරීම, ආර්ථික සංවර්ධනය සඳහා අනෙකුත් පළාත් සමග ඇති සම්බන්ධතා වැඩිදියුණු කිරීම, හා පසුබෑමට ලක්වී ඇති ප්‍රදේශ ආර්ථික සංවර්ධනය සඳහා යොමු කිරීම අපේක්ෂා කෙරේ. වඩාත් හොඳ ප්‍රවාහන සේවාවක් සැපයීම හා දුම්රිය හා බස් සේවා අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවා නගාසිටුවීමට ද අපේක්ෂා කරයි.

ත්‍රිකුණාමල වරාය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මගින් සංවර්ධනය කිරීමට අපේක්ෂිත අතර, එම වරාය අවට ප්‍රදේශයේ ඇති අක්කර 10,565 ක භූමි ප්‍රදේශය යොදාගනිමින් වරාය නගරයක් ලෙසට සංවර්ධනය කෙරෙනු ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ ඔලුවිල් ප්‍රදේශයේ

ධීවර වරායක් ද සංවර්ධනය කෙරෙමින් පවතී. මේ යටතේ විශාල නාවික යාත්‍රා රැඳවීම සඳහා පහසුකම් සැපයීමට දියකඩන දෙකක් ඉදිකිරීමට හා නාවික තටාකාංගනය ගැඹුරු කිරීමට අපේක්ෂිතයි. මෙම මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට අමතරව, නල ජලය ලබාගැනීමට ඇති අවස්ථා වැඩිදියුණු කිරිම මගින් කලාපය තුළ ජල සැපයුම හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමට ද නැගෙනහිර නවෝදය මගින් අපේක්ෂා කෙරේ.

නැගෙනහිර පළාත නගාසිටුවීම, එම පළාතෙහි ජනතාවගේ ජීවනෝපායයන් වැඩිදියුණු කිරීමට පමණක් නොව එහි ප්‍රතිලාභ ලැබීම තුළින් යාබද පලාත් ද සංවර්ධනය කරා යොමුවිය හැකි ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමට හේතුවනු ඇති අතර, එය මුළු රටෙහිම ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට දායකවනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ:**

1. තුන් අවුරුදු නැගෙනහිර පලාත් සංවර්ධන සැලසුම: 2007-2010, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 2007 නොවැම්බර්.
2. අයවැය කතාව : 2008, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 2007 නොවැම්බර්.

2008 වසරේදී ලෝක ආර්ථිකය මඳ වශයෙන් පසුබෑමකට ලක් වෙතැයි පුරෝකතනය කළද, නැගී එන හා දියුණු වෙමින් පවතින ආර්ථිකයන් ඉහළ වේගයකින් වර්ධනය වෙතැයි බලාපොරොත්තු වන නිසා ඛනිජ තෙල් මිල ගණන් දිගටම ඉහළ මට්ටමක පවතී යැයි අපේක්ෂා කළ හැකිය. සැපයුමෙහි ඇති විය හැකි කම්පන හෝ භූ-දේශපාලනික සාධක නිසා තවදුරටත් තෙල් මිල ගණන් ඉහළ යා හැකි අතර, එමගින් ඉහළ උද්ධමනකාරී තත්ත්වයක් ඇතිවිය හැක. උද්ධමනකාරී තත්ත්වයට බලපාන තවත් සාධකයක් ලෙස, බහුතරයක් සංවර්ධිත හා නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි නිමැවුම් පරතරය අඩුවීම සැලකිය හැකිය. මෑතකාලීනව එම රටවල අඛණ්ඩව වාර්තා වූ ඉහළ ආර්ථික වර්ධනය නිසා නිෂ්පාදන ධාරිතාව සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගෙන ඇති අතර, එය නිමැවුම් පරතරය අඩුවීමට බලපා ඇත. මෙවැනි ආර්ථිකයන් තවදුරටත් ප්‍රසාරණය වුවහොත් ඉහළ වැටුප් සඳහා ඉල්ලුමක් මෙන්ම පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් ඇති කෙරෙනු ඇත. කෙසේ නමුත්, ගෝලීය මූල්‍ය වෙළෙඳපොළේ මෑතකාලීනව ඇති වූ කැළඹිලි සහිත ස්වභාවය මෙම රටවල ආර්ථික වර්ධනය මන්දගාමී කිරීමටත් ශ්‍රම වෙළෙඳපොළේ පීඩනය ලිහිල් කිරීමටත් හේතු වනු ඇත. එමනිසා දියුණු රටවල ආර්ථිකයන්හි පසුබෑමක් සමඟ උද්ධමනකාරී පීඩනය සීමා වීමට ඉඩ ඇති නමුත්, සමහර රටවලට එමගින් අනාගතයේදී දෙවනුව ඇතිවිය හැකි බලපෑම් පිළිබඳව දැඩි අවධානයක් යොමු වී ඇත. සමහර නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි පවත්නා උද්ධමනකාරී තත්ත්වය ප්‍රතිපත්ති තීරණවලදී සලකා බලන ප්‍රධාන කරුණක් වනු ඇත.

## 1.4 මැදිකාලීන සාර්ව ආර්ථික ඉදිරිදැක්ම, අභියෝග සහ ප්‍රතිපත්ති

දස අවුරුදු දැක්ම මගින් ආර්ථිකයේ ප්‍රධාන අංශවල පුළුල් වර්ධනයක් සහිතව ආර්ථිකය **මැදිකාලීනව සියයට 8 කට වඩා වැඩි වර්ධන වේගයක් අත්කර ගැනීමට ඉලක්ක කර ඇත.** රජය විසින් පළාත් කිහිපයක යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කිරීම, දැනටමත් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබීම මෙන්ම පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන “නැගෙනහිර නවෝදය” යනාදියත් සමග මැදි කාලයේදී ආර්ථිකයේ වර්ධන ප්‍රවනතාව තවදුරටත් අඛණ්ඩව පවත්වා ගතහැකි වනු ඇත (විශේෂ සටහන 2). ඉහළ වර්ධනයට උපකාරී වෙමින් මැදිකාලයේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශ ආයෝජන තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. සමස්ත ආයෝජන ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස මැදි කාලයේදී සියයට 30 ක් ඉක්මවා යනු ඇති බවට පුරෝකතනය කර ඇත. පෞද්ගලික ආයෝජන ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 22 කට වඩා වැඩි ප්‍රමාණයකින් සහ රාජ්‍ය ආයෝජන සියයට 8 කට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකතනය කර ඇත. දේශීය හා විදේශීය ආයෝජන ධෛර්යමත් කිරිම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව යටිතල පහසුකම් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**මෑත වසරවලදී සැලකිය යුතු ප්‍රමාණයකින් සෘජු විදේශ ආයෝජන ලැබීම් ඉහළ ගිය අතර, 2007 වසරේදී ආයෝජන මණ්ඩලය විසින් අනුමත සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණනාවක් තුළින් පෙන්නුම් කෙරෙන පරිදි එම ප්‍රවනතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය සහිතව ආයෝජන කටයුතු සිදු කිරීමට රජය දිරිගන්වන අතර, 2008 අයවැයෙහි සඳහන් ආකාරයට පෞද්ගලික අංශය විසින් විදේශ ණය ගැනීමේදී පවතින සීමාවන් ද ලිහිල් කිරීමට අදහස් කරන බැවින්, මැදි කාලෙයේදී පෞද්ගලික අංශය ඔවුන්ගේ ආයෝජන සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළින් ප්‍රාග්ධනය ලබා ගැනීම ඉහළ යනු ඇත. අඛණ්ඩ ගෝලීය වර්ධනයත් සමඟ

**1.5 සංඛ්‍යා සටහන**

## මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව 2006-2011 (අ)

| දර්ශකය | ඒකකය | 2006 | 2007 (ආ) | පුරෝකථන 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | | | | |
| වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 2,939 | 3,578 | 4,307 | 5,047 | 5,923 | 6,911 |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 7.7 | 6.8 | 7.0 | 7.5 | 8.2 | 8.5 |
| උද්ධමනය - ද.දේ.නි. අවධමනකය | සියයට | 11.3 | 14.0 | 12.5 | 9.0 | 8.5 | 7.5 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 28.0 | 27.9 | 30.0 | 31.5 | 32.5 | 33.2 |
| පෞද්ගලික අයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 20.9 | 20.7 | 22.0 | 23.0 | 24.4 | 25.2 |
| රජයේ ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 7.1 | 7.2 | 8.0 | 8.5 | 8.1 | 8.0 |
| ප්‍රාග්ධන නිමැවුම් වෘද්ධි අනුපාතය | | 3.4 | 4.1 | 4.0 | 4.0 | 3.8 | 3.8 |
| දේශීය ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 17.0 | 17.6 | 20.4 | 22.1 | 23.3 | 24.5 |
| පෞද්ගලික ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 19.4 | 19.2 | 19.5 | 20.3 | 20.8 | 21.6 |
| රජයේ ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | -2.4 | -1.6 | 0.9 | 1.8 | 2.5 | 2.9 |
| ජාතික ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 22.3 | 23.4 | 25.7 | 27.4 | 28.5 | 29.5 |
| **විදේශීය අංශය** | | | | | | | |
| වෙළෙඳ පරතරය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | -3,371 | -3,560 | -3,970 | -4,365 | -4,803 | -5,149 |
| අපනයන | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 6,883 | 7,740 | 8,529 | 9,395 | 10,339 | 11,356 |
| ආනයන | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 10,254 | 11,301 | 12,499 | 13,760 | 15,142 | 16,505 |
| සේවා | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 257 | 238 | 312 | 370 | 414 | 478 |
| ලැබීම් | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 1,625 | 1,712 | 1,938 | 2,156 | 2,364 | 2,592 |
| ගෙවීම් | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 1,368 | 1,474 | 1,626 | 1,786 | 1,949 | 2,114 |
| ජංගම ගිණුමේ ශේෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | -1,498 | -1,369 | -1,545 | -1,664 | -1,881 | -1,974 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.3 | -4.2 | -4.0 | -3.9 | -3.9 | -3.7 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 204 | 531 | 400 | 396 | 388 | 376 |
| විදේශීය නිල සංචිත (ආනයනික මාස) | මාස | 3.0 | 3.3 | 3.3 | 3.2 | 3.2 | 3.2 |
| ණය සේවා අනුපාතය (ඇ) | ප්‍රතිශතය | 12.8 | 13.0 | 14.9 | 13.3 | 9.6 | 8.8 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඈ)** | | | | | | | |
| ආදායම | ද.දේ.නි.යේ % වශයෙන් | 16.3 | 15.8 | 17.4 | 18.0 | 18.5 | 18.5 |
| වියදම | ද.දේ.නි.යේ % වශයෙන් | 24.3 | 23.5 | 24.2 | 23.9 | 23.7 | 23.3 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -2.4 | -1.6 | 0.9 | 1.8 | 2.5 | 2.9 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -8.0 | -7.7 | -6.8 | -5.8 | -5.2 | -4.8 |
| දේශීය මූල්‍යනය | ද.දේ.නි.යේ % වශයෙන් | 5.6 | 3.6 | 3.6 | 2.6 | 2.2 | 2.1 |
| **මූල්‍ය අංශය (ඉ)** | | | | | | | |
| සංචිත මුදල් වර්ධනය | සියයට | 21.2 | 10.2 | 15.0 | 15.0 | 14.5 | 14.5 |
| පුළුල් මුදල් වර්ධනය (M2b) | සියයට | 17.8 | 16.6 | 15.5 | 15.5 | 15.0 | 15.0 |
| පටු මුදල් වර්ධනය (M1) | සියයට | 12.6 | 2.7 | 5.5 | 5.5 | 5.0 | 5.0 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වර්ධනය | සියයට | 24.0 | 19.3 | 17.5 | 17.0 | 16.5 | 16.8 |
| රාජ්‍ය අංශයට ණය දීම්වල වර්ධනය | සියයට | 38.8 | 8.9 | -3.1 | -0.7 | -0.7 | -0.7 |

(අ) 2008 මාර්තු මැද වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) තාවකාලික
(ඇ) මුළු ණය සේවා ගෙවීම් වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවාවන්ගේ ඉපැයීම්වල ප්‍රතිශතයක් වශයෙන්
(ඈ) නාමික ද.දේ.නි. අගයන් සංශෝධනය වීම හේතුවෙන් 2008 වසරේ සිට පුරෝකථනය කළ රාජ්‍ය මූල්‍ය අංශයේ අනුපාත 2008 වසරේ අයවැයෙහි ප්‍රකාශිත අනුපාතයන්ගෙන් වෙනස් වේ.
(ඉ) වර්ෂය අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලයන්: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය
ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා ඇති විදේශීය ඉල්ලුම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ඉහළ ආර්ථික වර්ධනයට උපකාරීවනු ඇත.

**උප-ප්‍රාථමික උකස් වෙළෙඳපොළෙහි ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් සහ ණය සංකෝචනය හේතුවෙන් 2008 වසරේදී ගෝලීය ආර්ථිකය සියයට 4.1 ක අඩු වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කළ ද, එය මැදි කාලයේදී යථා තත්ත්වයට පත්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2007 වසර අවසානය වනවිට සංවර්ධිත කටයුතුවලට සහාය වන රටවලින් රජයට එ.ජ. ඩොලර් බිලියන 4.2 ක මුදලක් ඉදිරි කාලය තුළදී ලබාදෙන බවට සහතික වී තිබුණි. සාම්ප්‍රදායික ද්විපාර්ශ්වීය හා බහු පාර්ශ්වීය ආධාර සපයන්නන් වෙනුවට නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් වන චීනය, ඉන්දියාව සහ ඉරානය වැනි රටවල් නව සංවර්ධන සහායකයින් බවට පත්ව ඇත. ද්වි පාර්ශ්වීය සහ බහු පාර්ශ්වීය මූලයන්ගෙන් විවිධ ව්‍යාපෘති සඳහා මුදල් සැපයීමට නව මූල්‍යන ගිවිසුම් සඳහා සාකච්ඡා පවත්වාගෙන යනු ලබයි. ඒ සමඟම, ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ රුපියල් වලින් නිකුත්කල භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන

සඳහා විදේශීය ආයෝජකයන්ට අනුමැතිය ලබා දීම සමඟ රජයට විදේශ අරමුදල් ලැබෙන මාර්ග වර්ධනය විය. මෙම බැඳුම්කර නිකුතුවලින් වූ ලැබීම් ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට ලංකාව විසින් කළයුතු ආයෝජන ප්‍රමාණයන් ආවරණය කිරීම සඳහා මෙන්ම දැනට කරගෙන යන ව්‍යාපෘතිවල අරමුදල් හිඟතාවයන් ආවරණය සඳහා යොදාගත හැකි වනු ඇත.

**රාජ්‍ය මූල්‍ය අංශය පිළිබඳව සලකනවිට මැදිකාලයේදී පුනරාවර්තන වියදම් අබිබවා ආදායම් අතිරික්තයක් නිර්මාණය කිරීම සඳහා ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 19 ක් පමණ දක්වා ආදායම වර්ධනය කරගැනීමටත්, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය වියදම සියයට 23 ක පමණ ප්‍රමාණයකට සීමා කිරීමටත් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය සියයට 5 ක පමණ මට්ටමක පවත්වාගෙන යෑමටත් රජය විසින් ඉලක්ක කරනු ලැබ ඇත.** බදු ආදායම වැඩි කිරීම සඳහා බදු ගෙවීම් පැහැර හැරීම සහ බදු ගෙවීම් මඟහැරීම අඩු කිරීම අවශ්‍ය වන අතර, රජය විසින් බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ නීතිමය හා නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගතයුතු වේ. මේ අතර, මැදිකාලීන ඉහළ වර්ධන පුරෝකථනයන්ට අනුව 2011 වසරේදී ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය සියයට 67 ක මට්ටමකට අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ශීඝ්‍රයෙන් වැඩිවන වෙළෙඳ භාණ්ඩ මිල පිළිබඳව සලකා බලනවිට, පවතින ඉහළ උද්ධමනය තනි අංකයක මට්ටමකට ගෙන ඒම ඉතා අභියෝගාත්මක කාර්යයක් වේ.** ශ්‍රී ලංකා මහ බැංකුව 2008 හා ඉන් ඉදිරියට මුදල් සහ මූල්‍ය අංශයන්හි ප්‍රතිපත්ති පෙර දැක්ම මගින් ප්‍රකාශ කළ පරිදි 2008 වසර අවසානය වනවිට උද්ධමනය සියයට 10 - 11 වැනි අඩු අගයකට ගෙන ඒමට අදාළ ක්‍රමෝපායයන් ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද, ලෝක ආර්ථිකයෙහි විවිධ වර්ධනාත්මක තත්ත්වයන් එනම් විශේෂයෙන් තෙල් සහ අත්‍යවශ්‍ය වෙළෙඳ භාණ්ඩවල ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන්හි ඇතිවන වෙනස්වීම් මෙම ඉලක්කය ඉටුකර ගැනීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ඇත. ඇතැම් ආහාර බෝග ජීව ඉන්ධන නිපදවීම සඳහා භාවිතා කිරීම සහ අයහපත් කාලගුණ තත්ත්වයන් නිසා වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ශීඝ්‍ර ලෙස ඉහළයෑම හේතුවෙන් ජාත්‍යන්තරව උද්ධමනකාරී පීඩන වර්ධනය වී ඇත. මෙම වාතාවරණය යටතේ මුදල් ප්‍රතිපත්තිය යොමුවනු ඇත්තේ අඛණ්ඩ ආර්ථික වර්ධනයට බාධා නොවන පරිදි වැඩිවන දේශීය ඉල්ලුමෙන් ඇතිවන උද්ධමනකාරී පීඩන පාලනය කිරීම සඳහාය. මැදිකාලීනව උද්ධමනය ඉලක්ක කරගත් මුදල් ප්‍රතිපත්ති රාමුවකට යොමුවීමේ අරමුණ සහිතව, ගෝලීය වර්ධනයන් සැලකිල්ලට ගෙන මුදල් ඉලක්ක කරගත් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම හා නවීකරණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකර ඇත (විශේෂ සටහන 1).

**උද්ධමනය සැළකිය යුතු අඩු මට්ටමකට ගෙනඒම සඳහා මුදල් ප්‍රතිපත්තියේ ක්‍රියාකාරිත්වයට රාජ්‍ය අයවැය ප්‍රතිපත්තිය ද උපකාරී වේ යැයි අපේක්ෂා කෙරේ.** ඉහළ හා තිරසාර ආර්ථික වර්ධනයකට සහ විනිමය අනුපාතයේ ස්ථායීතාවයට හේතුවන පරිදි අඩු උද්ධමන මට්ටමක් අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා මුදල් කළමනාකරණයට පහසුකම් සලසනු පිණිස රජය විචක්ෂණශීලි සහ තිරසාර රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමෝපායයන් පවත්වාගෙන යා යුතුය. රජය සහ රාජ්‍ය ව්‍යවසායකත්ව ආයතන සිය ආදායම් හිඟතාව මූල්‍යනය කිරීමට බැංකු අංශයෙන් ණය ලබා ගැනීම නිසා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා ඇහිරී ගොස් එය රටේ වර්ධන හැකියාවන්ට අහිතකර ලෙස බලපානවා පමණක් නොව, මෙම ණය ගැනීම් පොලී අනුපාතිකවලට සංවේදී නොවන නිසා මුදල් කළමණාකරණයෙහි ඵලදායී බව ද දුර්වල කරයි. වර්තමානයේ රජයේ මුළු ආදායමින් සියයට 75ක පමණ ප්‍රමාණයක් වැටුප් සහ වේතන, විශ්‍රාම වැටුප් සහ පොලී ගෙවීම් ආදිය සඳහා අවශෝෂණය කර ගන්නා බැවින්, අත්‍යවශ්‍ය රාජ්‍ය ආයෝජන ඇතුළත් රජයේ අනෙකුත් වියදම් සඳහා ඉතිරි වන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. රාජ්‍ය සේවයට අඛණ්ඩව බඳවා ගැනීම් සහ රාජ්‍ය ණය ගැනීම් ඉහළයාම නිසා වැටුප් හා වේතන ගෙවීම් ඉහළයාම මෙන්ම පොලී ගෙවීම් ඉහළයාම හේතුවෙන් වර්තන ගිණුමේ හිඟය ඉහළ යා හැකිය. මේ අතර, රජයේ සහනාධාර වියදම සහ සහනාධාර හේතුවෙන් සිදුවන ඉහළ පරිභෝජනය අඩු කිරීම සඳහා සමාජයේ පීඩාවට පත්වන කොටස් ආරක්ෂා කිරීමට යම්කිසි වැඩ පිළිවෙලක් සහිතව ඉහළ යන ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන්වල බලපෑම ක්‍රමයෙන් අවසාන පාරිභෝගිකයා වෙතට යොමු කළයුතු වේ. මේ අනුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රමෝපායයන් මූලික වශයෙන් රජයේ පුනරාවර්තන වියදම තාර්කීකරණය කිරීම සහ රජයේ බදු ආදායම් වැඩි කිරීම කෙරෙහි යොමු විය යුතුය. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ඇතිවන ඕනෑම යහපත් ප්‍රතිඵලයක් මැදිකාලයේදී ඉහළ වර්ධනයක් සහ අඩු උද්ධමනයක් සඳහා හේතුවන යහපත් මුදල් කළමනාකරණයක් පවත්වාගෙන යෑමට උපකාරි වනු ඇත.

**රාජ්‍ය ණය සඳහා වන පිරිවැය අවම කිරීමට හා ණයවල පරිණත කාලය දීර්ඝ කිරීමට ශක්තිමත් රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රමවේදයක් අවශ්‍ය වේ.** මෑත

වසරවලදී ඉහළ උද්ධමනාත්මක අපේක්ෂා හේතුවෙන් වෙළෙඳපොළ කැමැත්ත කෙටිකාලීන පරිණතවීම් දෙසට යොමු වූ බැවින් රජයේ දේශීය ණය ලබා ගැනීම කෙටිකාලීන පරිණතවීම්වල ඒකරාශී විය. මෙය ණය ආපසු ගෙවීම් ඒකරාශී වීමටත්, කල්පිරෙන සුරැකුම්පත් ඉහළ අනුපාතිකයන් යටතේ යළි නිකුත් කිරීමටත් හේතු වී ඇත. රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ තවදුරටත් දියුණු කිරීමට හා රජය ලබා ගන්නා ණයවල පිරිවැය අඩු කිරීමට හැකිවන ලෙස රාජ්‍ය ණය කළමනාකරණ උපක්‍රම සකස් කිරීමේදී රජයේ මුදල් ප්‍රවාහ සහ ඵලදා වක්‍රය ශක්තිමත් වන ලෙස, වෙළෙඳපොළ තුළ දිගුකාලීන පරිණත කාලයක් සහිත සුරැකුම්පත් නිකුත් කිරීම මගින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එමෙන්ම, බැංකු තැන්පතු සඳහා දෙනු ලබන පොලී අනුපාතිකයන්ට සාපේක්ෂව ඉහළ ඵලදාවක් සහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට මහජනයාගේ දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳව මහජනතාව තවදුරටත් දැනුවත් කළ යුතුය.

**විදේශීය ණය ලබාගැනීම නිසා රටේ අනාගත ණය බර වැඩි වන බැවින්, පුළුල් වෙමින් පවතින ඉතිරි කිරීම් ආයෝජන පරතරය පියවීමට, ණය නොවන විදේශ ලැබීම් කෙරෙහි වැඩි වශයෙන් යොමුවීම අවශ්‍ය වේ.** මීට අමතරව, ආයෝජන ප්‍රවාහ මගින් සාමාන්‍යයෙන් නවීන තාක්ෂණය, කළමනාකරණ නිපුණතා, හා විදේශ වෙළෙඳපොළ ප්‍රවේශයන් වැනි වාසි රටට ලබාගත හැකිය. නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ වැඩි ජනගහනයක් සහිත ඉන්දියාව හා පකිස්ථානය යන රටවල් සඳහා වන වෙළෙඳ ප්‍රවේශ වැඩිකර ගැනීම විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට දිරි ගැන්වීමක් වනු ඇත. විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා ආසියාවේ වඩාත් හොඳ ක්‍රියාකාරිත්වයක් ඇති කොටස් වෙළෙඳපොළවලින් එකක් ලෙස ප්‍රචලිත කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමට දේශීය සමාගම් උනන්දු කරවීම අවශ්‍ය වේ. තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට හැකිවන ලෙස වෙළෙඳාම සහ විදේශ සෘජු ආයෝජන දිරිමත් කළයුතු අතර, මූලික යටිතල පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සංවර්ධනය කිරීම සඳහා විශාල ව්‍යාපෘති සඳහා විදේශ සෘජු ආයෝජන උනන්දු කරවිය යුතුය. මේ සම්බන්ධයෙන් සලකනවිට, බදු විරාම හා බදු නිදහස් කිරීම් සැපයීමට වඩා අවධානය යොමු කළ යුත්තේ නීතිය හා සාමය පවත්වාගෙන යාම, ව්‍යාපාර කිරීමේ ක්‍රියා පිළිවෙත් පහසු කිරීම, නීති පද්ධතිය හා ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම, නිලධාරිවාදී බාධා ඉවත් කිරීම, රේගු ක්‍රියා පටිපාටි ලිහිල් කිරීම, ස්ථායී සාර්ව ආර්ථික පරිසරයක් පවත්වාගෙනයාම හා දියුණු යටිතල පහසුකම් සැපයීම යනාදිය කෙරෙහිය. එමෙන්ම, යටිතල පහසුකම් සහ වෙනත් පහසුකම් සංවර්ධනය සඳහා රජය විශාල ලෙස ආයෝජනය කරන නිසා රජයේ බදු ආදායම් වැඩි කරගත හැකි ලෙස ආයෝජකයින්ට සපයන බදු විරාම හා විවිධ බදු නිදහස් කිරීම් තාර්කිකරණය කිරීම අවශ්‍ය වේ.

**බලශක්ති අංශය තුළ පවතින ව්‍යුහාත්මක දුර්වලතා විශාල ගැටලුවක් බවට පත්වී ඇති බැවින් තවදුරටත් ප්‍රමාද නොවී ඒ පිළිබඳ ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය වන අතර, එය රටේ අනාගත වර්ධනාත්මක තත්ත්වයන්ට පහසුකම් සැලසීමටත් ලංකා විදුලි බල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාණිජමය ශක්‍යතාවය වැඩි දියුණු කිරීමටත් හේතු වනු ඇත.** කලාපයේ අනිකුත් රටවල් හා වාණිජමය වශයෙන් තරඟකාරී රටවල් සමඟ සන්සන්දනය කරන විට ශ්‍රී ලංකාවේ බලශක්ති ඒකකයක පිරිවැය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී. නිමැවුම් කර්මාන්ත, කෘෂි සැකසුම් කර්මාන්ත, සුළු කර්මාන්ත හා සේවා අංශයේ කර්මාන්ත සඳහා බලශක්තිය අත්‍යවශ්‍ය යෙදවුමක් වන බැවින් මෙම කර්මාන්තවල තිරසාර වර්ධනය සඳහා සාධාරණ පිරිවැයක් යටතේ අඛණ්ඩව බලශක්ති සැපයුම තහවුරු කිරීම අවශ්‍ය වේ. විවිධ ව්‍යුහාත්මක දුර්වලතා හේතුවෙන් බලශක්ති අංශය තවදුරටත් රාජ්‍ය ඒකාධිකාරයක් ලෙස පවතින අතර, මෙය ලං.වි.ම.යෙහි වාණිජමය යෝග්‍යතාවය පිළිබඳව සොයා බැලීමේ අවශ්‍යතාවය ඉස්මතු කර ඇත. පෞද්ගලික අංශය අයහපත් කොන්දේසි හා නියමයන් යටතේ ලං.වි.ම.ට අවශ්‍ය තාප විදුලිබල නිෂ්පාදනයේ යෙදී සිටින අතර, එය බලශක්ති නිෂ්පාදිත පිරිවැය සාධාරණ මට්ටම ඉක්මවා යෑමට හේතු වී ඇත (විශේෂ සටහන 7). සාධාරණ පිරිවැයක් යටතේ, අඛණ්ඩව බල ශක්ති සැපයීම සහ ලං.වි.ම.යේ වාණිජමය ශක්‍යතාවය තහවුරු කිරීම සඳහා, පෞද්ගලික බලශක්ති නිපදවන්නන්ගෙන් තරඟකාරී ලංසු ක්‍රමයක් මත පදනම් වූ නිසි ලෙස ව්‍යුහගතකරන ලද රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ අඩු පිරිවැයකට බලශක්ති අවශ්‍යතා ලබා ගැනීම සිදුකළ යුතුය. තවදුරටත්, ලං.වි.ම.යේ වාණිජමය ශක්‍යතාවය තහවුරු කිරීම සඳහා එහි ව්‍යුහාත්මක ගැටළු විසඳීමට නව ක්‍රමෝපායයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම ලං.වි.ම.යේ මූල්‍ය ශක්‍යතාවය තවදුරටත් දුර්වල කරනු ඇති අතර, ඉහළ ගාස්තු හා දුර්වල සැපයුම හේතුවෙන් සියලුම අංශවල වර්ධනයට අහිතකර තත්ත්වයක් ඇති කරන බැවින්, එය රටේ අනාගත දියුණුව සඳහා අයහපත් ආකාරයෙන් බලපායි.

**ශ්‍රී ලංකාව ඛනිජ තෙල් ආනයනකරුවකු ලෙස ලෝක වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල අඛණ්ඩව ඉහළයාමේ අභියෝගයට සාර්ථකව මුහුණ දී ඇත.** එහෙත් තෙල් මිල ගණන් දැරිය හැකි මට්ටම ඉක්මවුවහොත් එය විදේශීය අංශය දැඩි අපහසු තත්ත්වයකට පත්කරනු ඇත. 2008 වර්ෂයෙහි ලංකාවේ ඛනිජ තෙල් ආනයන පිරිවැය එ.ජ.ඩොලර් බිලියන 3 ක් ඉක්මවනු ඇතැයි පුරෝකතනය කර ඇති අතර, එය ලංකාවේ මුළු ආනයන පිරිවැයෙන් සියයට 25 ක් වේ. මේ තත්ත්වය තුළ ලංකාවට විදේශ මාර්ගවලින් ප්‍රමාණවත් පරිදි මුදල් ලැබීම් සිදු නොවුවහොත් එය ගෙවුම් ශේෂය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරනු ඇත. එබැවින් බලශක්ති පිරිමැසුම් සහිත උපකරණ භාවිතය තුළින් ඛනිජ තෙල් ආනයනය අඩු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම, ඉහළ ඉන්ධන භාවිතයක් සහිත මෝටර් රථ ආනයනය අධෛර්යවත් කිරීම, මාර්ග තදබදය පාලනය කිරීම, ජාත්‍යන්තර මිල වැඩිවීම් අවසාන පාරිභෝගිකයා වෙතට යොමු කිරීම, අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය හා පළාත් පාලන ආයතනවල මෝටර් රථ හා වෙනත් බල ශක්ති භාවිතය අරපිරිමැස්මෙන් සිදු කිරීම සහ බලශක්තිය පිරිමැසීමේ අවශ්‍යතාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම වැනි ක්‍රියා මාර්ග මගින් සාර්ව ආර්ථික ස්ථායීතාව මත ඛනිජ තෙල් මිල ඉහළ යාමෙන් වන බලපෑම අඩු කිරීමට හැකිවනු ඇත.

**අකාර්යක්ෂම ගමනාගමන පහසුකම්, මාර්ග පද්ධතියේ අසතුටුදායක තත්ත්වය සහ මාර්ග තදබදය සියළුම නගරයන්හි පාහේ දක්නට ලැබෙන අතර, එය ඵලදායීතාවය අඩුවීමට හේතු වී ආර්ථික වර්ධනයට අයහපත් ලෙස බලපා ඇත.** ඉහළ ආර්ථික වර්ධනයට සහ වැඩිවන වාහන ප්‍රමාණයට සමගාමීව මාර්ග පද්ධතිය පුළුල් වී නොමැත. පවතින මාර්ග පද්ධතිය නිසි ලෙස නඩත්තු නොකිරීම දුර්වල මාර්ග පද්ධතියට මෙන්ම මාර්ග තදබදයට ද හේතු වී ඇත. පෞද්ගලික අංශයේ මැදිහත්වීමක් පැවතිය ද පොදු මගී ප්‍රවාහන සේවාවල තත්ත්වය වර්ධනය වී නොමැත. මෙහෙයුම් පිරිවැය සහ තෙල් මිල වැඩිවීම පැවතිය ද දිගු කාලයක් තිස්සේ සංශෝධනය නොකළ ගාස්තු හේතුවෙන් දුම්රිය පද්ධතිය තවමත් පාඩු ලබයි. දුර්වල මාර්ග පද්ධතියක් පැවතීම සහ මාර්ග තදබදය නිසා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ පිරිවැය ඉහළ නැඟ ඇති අතර, මෙය පාරිභෝගික භාණ්ඩවල පිරිවැය ඉහළ යෑම කෙරෙහි බලපෑම් ඇති කරයි. මීට අමතරව, මාර්ග තදබදය නිසා වන ඉන්ධන අපතේ යාම රටක් වශයෙන් දරා ගැනීමට අපහසු වේ. ඉහළ ආර්ථික වර්ධනයට මෙන්ම නිෂ්පාදන සාධකවල ඵලදායීතාවය වර්ධනයට හොඳ මාර්ග පද්ධතියකින් සමන්විත කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් පැවතීම අත්‍යවශ්‍ය වන අතර, මහා මාර්ග හා අධිවේගී මාර්ග ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය කඩිනම් කිරීමට සහ පොදු ප්‍රවාහන පද්ධතිය වර්ධනය කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගතයුතු වේ. එමෙන්ම, මාර්ග පද්ධතියේ සහ ප්‍රවාහන පද්ධතියේ වර්ධනය හේතුවෙන් ප්‍රාදේශීය නිෂ්පාදකයන්ට වෙළෙඳපොළට ප්‍රවේශවීමේ හැකියාව ලැබෙන අතර, එය දිළිඳුකම පිටුදැකීමේ රජයේ වෑයමට ආයකත්වයක් සපයයි.

**2007 වර්ෂයේ හතරවන කාර්තුවේදී සේවා වියුක්තිය මෙතෙක් පැවැති පහළම මට්ටමක් දක්වා අඩු වුව ද, ශ්‍රම ඵලදායීතාව සැලකිය යුතු ලෙස වර්ධනය නොවුනහොත් එය ඉහළ ආර්ථික වර්ධන අපේක්ෂාවන් ළඟාකර ගැනීමට බාධාවකි.** මෑත වර්ෂවලදී ආර්ථිකයේ සිදු වූ ප්‍රසාරණය සහ රාජ්‍ය අංශයට සිදු කරනු ලැබූ බඳවා ගැනීම්වල ශීඝ්‍ර වර්ධනය හේතුවෙන් සේවා වියුක්ති අනුපාතය 2005 වර්ෂයේදී සියයට 7.7 සිට 2007 දී සියයට 6.0 දක්වා සැලකිය යුතු මට්ටමකින් පහත වැටුණි. නිශ්චිත පදනමකින් තොරව රාජ්‍ය අංශයට සිදු කරන බඳවා ගැනීම් මෙන්ම, කාර්ය සාධනය මත පදනම් නොවූ ප්‍රතිලාභ ලබාදීම තුළින් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය අධෛර්යවත් කරනු පමණක් නොව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය අපේක්ෂාවෙන් පෞද්ගලික අංශයේ සේවා නියුක්තියෙන් ඉවත් වීමට ද පෙළඹවීමක් ඇති කරයි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය වර්ධනය වීම නිසා රාජ්‍ය සේවයේ සේවක අතිරික්තයක් බිහිවීම, ඉහළ ඌන සේවා වියුක්තියක් ඇතිවීම සහ රජයේ වර්තන වියදම්වල ඉහළයාමක් සිදුවනවා පමණක් නොව, පෞද්ගලික අංශයේ සේවා හිඟයක් ඇති කිරීමට ද එය හේතු වේ. මේ නිසා, රාජ්‍ය සේවයට දක්ෂතා මත පදනම්ව අවශ්‍ය පුද්ගලයන් පමණක් බඳවා ගැනීමට කාර්යක්ෂම බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම අවශ්‍ය වේ.

**දිගින් දිගටම වර්ධනය වන ගෝලීය ආහාර මිල ගණන්, දේශීය කෘෂිකාර්මික අංශයේ ශක්තිමත් වර්ධනයට මහඟු අවස්ථාවක් උදාකර දී ඇත.** දේශීය හා වැවිලි කෘෂිකර්මාන්ත යන දෙඅංශයම 2007 වර්ෂයේ පැවති ඉහළ මිල ගණන් තුළින් ප්‍රතිලාභ ලැබූ අතර, මධ්‍යකාලීනව ද මෙම ප්‍රවණතාවය අඛණ්ඩව පවතිනු ඇත. 2007 වර්ෂයේදී තේ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 1ක් ඉක්මවූ අතර, තොග වශයෙන් අපනයනය කරනවාට වඩා අගය එකතු කිරීම මගින් අපනයනය කිරීම කෙරෙහි එමගින් තවදුරටත් උනන්දු කරවනු ලබයි. නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ අති විශාල ඉන්දියානු සහ පකිස්තානු වෙළෙඳපොළට ප්‍රවිශ්ටවීමට හැකිවනු ඇති අතර, එමගින් මෙම කර්මාන්තය එහි සමස්ත ධාරිතාවය දක්වා වර්ධනය කිරීමට හැකිවනු

ඇත. 2008 වර්ෂයේදී වී, පොල් සහ අනෙකුත් විවිධ කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි මිල ගනන් ඉහල ගිය අතර, මෙවැනි තත්ත්වයක් යටතේ, හඳුනාගත් බෝග සඳහා රජය විසින් ලබාදෙන පොහොර සහනාධාරය ඉවත් කළ යුතුය. ඒ වෙනුවට, රජය විසින් වාරිමාර්ග පහසුකම් වැනි කෘෂි-යටිතල පහසුකම් සැපයීම, වැව් සැකසීම ව්‍යාපෘති සේවාවන් සහ උපදේශාත්මක සේවාවන් සැපයීම මෙන්ම නොදියුණු ප්‍රදේශයන්ට ඉහළ තත්ත්වයේ මාර්ග පද්ධතීන් ලබාදීම සහ මෙම අංශයේ ඵලදායිතාවය වර්ධනය කිරීම තහවුරු කිරීමට අවශ්‍ය වන පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා අදාළ ආයෝජනයන් සිදුකළ යුතුය. ගොවීන් සහ වෙළෙඳුන් අතර ඉදිරි වෙළෙඳ ගිවිසුම් සංකල්පය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රධාන කෘෂිකාර්මික අංශ තුළ නිෂ්පාදිත අලෙවිකරණයට පවතින බාධාවන් සඳහා ඵලදායී විසඳුම් ලබාදීම තුළින් මිල ගණන් ස්ථායී කළ හැකිවනු ඇත (විශේෂ සටහන 11). වර්තමානයේදී කෘෂිකාර්මික අංශය ශ්‍රම හිඟතාවයකට ද මුහුණ දෙමින් සිටින බැවින්, වැවිලි කර්මාන්තයේ යම් නිශ්චිත සැකසුම් ක්‍රියාවලීන් සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය හඳුන්වාදීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, කෘෂිකාර්මික අංශයේ පවතින ගැටලු විසඳීමට දියුණු සහ ගතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම මෙන්ම, කෘෂි නිෂ්පාදිත වර්ධනය කිරීම තුළින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල සැපයුම වැඩි කිරීමටත් ඒ තුළින් ජීවන වියදමට සහනයක් ලබා දීමටත් හැකිවනු ඇත.

**දිවයිනක් ලෙස පවතින ශ්‍රී ලංකාව මෙතෙක් සාගර සම්පතෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන නොමැත.** වරින්වර බලයට පත් වූ රජයන් විසින් විවිධ දිරි ගැන්වීම් සැපයුව ද, රටෙහි මත්ස්‍ය නිෂ්පාදනය තවමත් උපරිම නිෂ්පාදන හැකියාවට වඩා පහළ මට්ටමක පවතී. රාජ්‍ය අංශය විසින් පෞද්ගලික අංශයේ ද සහභාගීත්වය ඇතිව වඩාත් ඵලදායි මත්ස්‍ය නිෂ්පාදන වර්ධන ක්‍රමෝපායයන් සකස් කිරීම තුළින් නිෂ්පාදිතය ඉහළ නැංවීමටත් නිෂ්පාදන අපනයනය තුළින් විදේශ විනිමය උපයා ගැනීමටත් හැකිවනු ඇත. එවැනි ක්‍රමෝපායයන් තුළින්, මුහුදු ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වී විශේෂයෙන්ම තරුණ ප්‍රජාව සඳහා තව තවත් රැකියා අවස්ථාවන් නිර්මාණයවීම සිදු වනු ඇති අතර, එය අනාගතයේදී ඉහල ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට දායක වනු ඇත. මෙම අංශය සඳහා දේශීය ආයෝජකයන් සහ විදේශීය ආයෝජකයන් යන දෙපාර්ශ්වයම ඉලක්ක කරගත් වර්ධන උපාය මාර්ග සකස්කිරීම තුළින් සහ රජය විසින් අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ නව තාක්ෂණ භාවිතය උනන්දු කරවීම තුළින් දේශීය අගය එකතු කිරීම වර්ධනය කිරීම වැදගත් වේ.

**මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණ කටයුතු 2007 වර්ෂය තුළදී ආරම්භ විය.** රජය විසින් ලබා ගන්නා ලද සයිසමික් දත්ත විමර්ශනය තුළින් මන්නාරම් ද්‍රෝණියේ සමීක්ෂණය කරන ලද ප්‍රදේශය තුළ හයිඩ්‍රොකාබන් (තෙල්/වායු) පැවතීමට විශාල ඉඩකඩක් පවතින බව පෙනී ගොස් ඇත. එම ප්‍රදේශය කොටස් අටකට වෙන් කරන ලද අතර, එයින් කොටස් 2 ක් දැනටමත් ඉන්දියාවට සහ චීනයට තෙල් ගවේෂණය සඳහා ලබා දී ඇත. මේ අතර, කොටස් 3 ක් සඳහා ඛනිජ සම්පත් සංවර්ධන කමිටුව විසින් කැනීම් බලපත්‍ර ලබාදීම සඳහා ජාත්‍යන්තරව තරඟකාරී ලංසු කැඳවා ඇති අතර, දැනට එම ලංසු විමර්ශණය කෙරෙමින් පවතී. ඛනිජ තෙල් සම්පත් කැණීම් සාර්ථකව සිදුකළ හැකි වුවහොත් එය රටේ ඉතාම වටිනා ස්වාභාවික සම්පත වනු ඇති අතර, එහි විශාල වාණිජමය වැදගත්කමක් පවතිනු ඇත. ඛනිජ තෙල් සම්පත් ගවේෂණය, වෘත්තීයමය නිපුණත්වයක් සහිතව, ඥානාන්විතව කළමනාකරණය කළහොත් එයින් රටට විශාල ආර්ථික හා සමාජ ප්‍රතිලාභ අත්කරගත හැකි වනු ඇත. එබැවින්, එයින් රටට අත්වන ප්‍රතිලාභ තිරසාර පදනමක් මත උපරිම වශයෙන් ලබා ගැනීම ඛනිජ තෙල් සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් සලකනවිට ප්‍රමුඛත්වය ලැබිය යුතු කරුණ වේ. එමනිසා තෙල් සම්පත් ගවේෂණ කටයුතු සාර්ථක වීමට අත්‍යවශ්‍ය අංගයන් වනුයේ වඩා ඵලදායි අලෙවිකරණය සහ එමගින් විශ්වසනීයත්වයක් සහිත ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම, තීරණවල විනිවිදභාවය සහ වගකීම් සහගත බව පවත්වා ගැනීම, දිගුකාලීන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සකස් කිරීම, කාර්යක්ෂම ආයතනික රාමුවක් සකස් කිරීම, දත්ත කළමනාකරණය සහ විශ්ලේෂණය ශක්තිමත් කිරීම, කළමනාකරණය, නියාමනය සහ අධීක්ෂණ ඵලදායී ලෙස සිදු කිරීම යනාදියයි. එමෙන්ම හයිඩ්‍රොකාබන් පවතින බවට සාක්ෂි ලැබී ඇති කාවේරි ද්‍රෝණිය ඇතුලු ශ්‍රී ලංකාවේ මුහුදු ආශ්‍රිත ප්‍රදේශවල ඛනිජතෙල් සම්පත ගවේෂණය කිරීමේ කටයුතු ද යුහුසුළුව ආරම්භ කළ යුතුව ඇත (විශේෂ සටහන 3).

**විශේෂ සටහන 3**

## මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් ගවේෂණය

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණ ප්‍රයත්නයන් පිළිබඳ ඉතිහාසය 1960 ගණන් දක්වා දිවයන බව 1967 දී ප්‍රථම වරට වයඹ වෙරළබඩ ප්‍රදේශවලින් සයිසමික් දත්ත ලබාගෙන තිබීමෙන් පැහැදිලි වේ. ඉන්පසු 1974 සහ 1981 අතර කාලය තුළ රුසියානු හා ඇමරිකානු සමාගම් වල සහයෝගය ඇතිව ගවේෂණාත්මක ළිං 7 ක් (ගොඩබිම ආශ්‍රිතව 3 ක් ද, මුහුදුබඩ නොගැඹුරු ජලයේ 4 ක් ද) කණින ලදී. මෙහිදී හයිඩ්‍රොකාබන් පවතින බවට සාක්ෂි ලැබුණද, එම තැන්පතු පිහිටා ඇති ගැඹුර හා ඒ කාලයේ පැවැති තාක්ෂණය සැලකීමේදී එහි වාණිජමය ශක්‍යතාවක් නොතිබුණ බැවින් තෙල් කැණීම සඳහා සැලකිය යුතු ප්‍රයත්නයක් නොදරන ලදී. එමෙන්ම ඒ සඳහා යොමුවූ දිගු කාලීන ප්‍රතිපත්තියක් හා සුදුසු ආයතනික රාමුවක් නොතිබීමද ඛනිජ තෙල් ගවේෂණයේ ප්‍රථම ප්‍රයත්නය අත්හැර දැමීමට හේතු විය.

තෙල් ගවේෂණයේ මෑත කාලීන ප්‍රයත්නයන් ආරම්භ වූයේ TGS-NOPEC යන නෝර්වීජියානු තෙල් සමාගම මගින් 2001 වසරේදී මන්නාරම් ද්‍රෝණියේ (අදියර I) සහ 2005 වසරේදි (අදියර II) සිදුකළ 2-D (Two-Dimensional) සයිසමික් සමීක්ෂණ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා රජය හා TGS-NOPEC සමාගමත් සමඟ ගිවිසුමකට එළඹීමත් සමඟය. ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ සිට ඉන්දියාවේ ගිණිකොණ දිග ජාත්‍යන්තර මුහුදු සීමාව දක්වා ප්‍රදේශය මෙම සයිසමික් සමීක්ෂණය මගින් ආවරණය කෙරිණි. මෙම ප්‍රදේශයේ මුහුදු ජලයේ ගැඹුර මීටර් 50 සිට මීටර් 3,000 අතර වෙනස් වේ. 2006 දී රජය සිය භාරයට ගත් සයිසමික් සමීක්ෂණ දත්ත විශ්ලේෂණයේදී එම ප්‍රදේශයේ හයිඩ්‍රොකාබන් (තෙල්/ස්වාභාවික ගෑස්) පැවැතිය හැකි බවට සැලකිය යුතු සාක්ෂි තිබෙන බව පෙන්වා දී ඇත. සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු නොකළද කාවේරි ද්‍රෝණියේ හා දිවයිනේ සෙසු මුහුදු ප්‍රදේශවල හයිඩ්‍රොකාබන් පැවැතීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවට විශ්වාස කෙරේ. තවද වසර 2002 දී ස්වීඩන සමාගමක් මගින් චන්ද්‍රිකා ගුරුත්ව සමීක්ෂණයක් ද පවත්වා ඇත.

ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ඛනිජ තෙල් ගවේෂණ කාර්යයෙහි ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදන ආයතනය ලෙස කටයුතු කරයි. ඒ සඳහා අවශ්‍ය නීතිමය පසුබිම 2003 අංක 26 දරණ ඛනිජ සම්පත් පනත මගින් සපයනු ලබයි. මෙම පනත අනුව ස්ථාපිත කරන ලද, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත, ඛනිජ සම්පත් සංවර්ධන කමිටුව (PRDC) පනතේ දක්වා ඇති විධිවිධාන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. අධ්‍යක්ෂ ජනරාල් කෙනෙකු යටතේ ක්‍රියාත්මක වන ඛනිජ සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙයි.

මන්නාරම් ද්‍රෝණියේ වර්ග කිලෝමීටර් 33,715 ක ප්‍රදේශයක් ආවරණය වන පරිදි, 2-D සයිසමික් දත්ත ලබාගෙන ඇති අතර, එම ප්‍රදේශය සංඛ්‍යා සටහන වි.3.1 හි දැක්වෙන පරිදි කොටස් අටකට වෙන් කොට ඇත. ලැබී ඇති දත්ත අනුව, මෙම කොටස් අටෙන් දෙකක් එනම් කොටස් අංක 1 ඉන්දියාවටත්, කොටස් අංක 8 චීනයටත් ඛනිජ තෙල් ගවේෂණය සඳහා, නම් කිරීමේ පදනම මත වෙන්කර ඇත. 2007 වසරේ අගෝස්තු හා සැප්තැම්බර් මාස තුළදී ආයෝජකයින් දැනුවත් කිරීමෙන් හා ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව, ඉතිරි කොටස් හයෙන් තුනක (කොටස් අංක 2, 3 හා 4) තෙල් ගවේෂණය සඳහා බලපත්‍ර ලබාදීමට, ඛනිජ සම්පත් සංවර්ධන කමිටුව විසින් ජාත්‍යන්තරව තරඟකාරී ලංසු කැඳවන ලද අතර දැනටමත් සමහර කොටස් සඳහා ලංසු ඉදිරිපත්ව ඇත.

මෙම ගවේෂණ කාර්යය සාර්ථක වුවහොත්, ඛනිජ තෙල් සම්පත අප රට සතුවන වාණිජමය වටිනාමක් සහිත අගනාම ස්වභාවික සම්පත වනු ඇත. ඛනිජ සම්පත් ගවේෂණය, සංවර්ධනය හා නිෂ්පාදනය නිසි කළමනාකරණයක් අනුව සිදු වුවහොත් ඒ තුළින් රටට අතිවිශාල ආර්ථික හා සමාජයීය වාසි අත්පත් කරගත හැක. ඛනිජ තෙල් සංවර්ධන ක්‍රියාවලියේ මූලික අරමුණ විය යුත්තේ මෙම සම්පත නිසියාකාරව හා නිවැරදිව කළමනාකරණය කරගැනීමෙන් රටට ලැබෙන වාසි උපරිම කිරීමයි. සමහර රටවල් මෙම ඛනිජ තෙල් සම්පත


**සංඛ්‍යා සටහන වි. 3.1**

**මන්නාරම් ද්‍රෝණියේ ඛණිජතෙල් ගවේෂණය සඳහා බලපත්‍ර නිකුත් කිරීම - කොටස්වල විස්තර**

| කොටස | වර්ග ප්‍රමාණය වර්ග කි.මී. | විශේෂ කරුණු |
|---|---|---|
| 1. | 3,501 | වෙන්කර ඇත. |
| 2. | 3,338 | ලංසු කැඳවා ඇත. |
| 3. | 3,572 | ලංසු කැඳවා ඇත. |
| 4 | 4,127 | ලංසු කැඳවා ඇත. |
| 5. | 6,644 | |
| 6. | 3,567 | |
| 7. | 3,970 | |
| 8. | 4,995 | වෙන්කර ඇත. |
| එකතුව | 33,714 | |
| 1 සහ 8 කොටස් හැර | 25,218 | |


මූලයः ඛනිජ තෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**වි.ස. 3.1 රූප සටහන** — **මන්නාරම් ද්‍රෝණිය**




මූලයː ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**වි.ස. 3.2 රූප සටහන** — **මන්නාරම් ද්‍රෝණීයේ ඛනිජතෙල් ගවේෂණය සඳහා වෙන්කර ඇති කොටස්**




මූලයː ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

නිසියාකාරව සංවර්ධනය නොකළ නිසා, එම සම්පත් සංවර්ධනය කිරීමෙන් ලැබිය හැකිව තිබූ අති විශාල වාසි භුක්ති විඳීමට අපොහොසත් වී ඇත. එබැවින් මෙම ඛනිජ තෙල් ගවේෂණ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා බොහෝ කරුණු බලපෑ හැක. සාර්ථක අලෙවිකරණය, විශ්වසනීය ආයෝජකයන් ආකර්ශනය කරගැනීම, තීරණවල විනිවිදභාවය හා වගකීම් සහගතභාවය පවත්වා ගෙන යාම, දිගුකාලීන ප්‍රතිපත්ති හා උපාය මාර්ග නිර්ණය කිරීම, කාර්යක්ෂම ආයතනික ව්‍යුහයක් ගොඩනැගීම, දත්ත කළමනාකරණය හා විශ්ලේෂණය ශක්තිමත් කිරීම, කාර්යක්ෂම නීති පද්ධතියක් ඇති කිරීම සහ කළමනාකරණය හා ඇගැයීම වැනි කරුණු ඛනිජ තෙල් ගවේෂණය සාර්ථක කරගැනීමට උපකාරී වනු ඇත.

සයිසමික් සමීක්ෂණ දත්ත අනුව හයිඩ්‍රොකාබන් තැන්පතු පිහිටා ඇතැයි විශ්වාස කරනුයේ මන්නාරම් ද්‍රෝණියේ ගැඹුරු මුහුදේ (මීටර් 400 - මීටර් 1,500) හා ඉතා ගැඹුරු මුහුදේ (මීටර් 1,500 ට වැඩි) බැවින් තෙල් ගවේෂණය වඩා අපහසු හා වියදම් අධික කාර්යයක් බවට පත්වී ඇත. ඇස්තමේන්තුවලට අනුව ගැඹුරු මුහුදේ තෙල් ළිඳක් කැණීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 60 ක පමණ වියදමක් දැරීමට සිදුවෙයි. තෙල් ඇති බවට සනාථ වී ඇති ක්ෂේත්‍රයක වුවද, තෙල් ගවේෂණය, අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා නිෂ්පාදනය ආරම්භකිරීම සඳහා සාමාන්‍යයෙන් වසර 7 - 8 ක කාලපරිච්ඡේදයක් ගතවෙයි. එසේම, ලෝක වෙළෙඳපොළේ පවතින ඉහළ තෙල් මිල නිසා බොහෝ රටවල් තෙල් ගවේෂණය සඳහා නව තෙල් ගවේෂණ ප්‍රදේශ විවර කිරීමත්, ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම සඳහා විවිධ ප්‍රතිලාභ හඳුන්වාදීමත් සිදුකෙරමින් පවතී. එබැවින් මන්නාරම් ද්‍රෝණිය මෙතෙක් තෙල් ලබාගත් ප්‍රදේශයක් නොවන බැවින් ශ්‍රී ලංකාවට පිළිගත් ආයෝජකයන් ආකර්ශනය කරගැනීම සඳහා වඩා වැඩි අවධානයක් යොමු කළයුතුව ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රොත්සාහයන් සැපයීමට වඩා, අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි වැඩි විශ්වසනීයත්වයක්, විනිවිදභාවයක් හා වගකීම් සහගතභාවයක් පවත්වාගැනීම පිළිගත් ආයෝජකයින් අපවෙත ආකර්ෂණය කර ගැනීමට වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

ඛනිජ තෙල් ගවේෂණය, සංවර්ධනය හා නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට, කළමනාකරණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා අධීක්ෂණය කිරීමට කාර්යක්ෂම ආයතනික රාමුවක් අවශ්‍ය වේ. මේ අනුව බලන විට ඛනිජ තෙල් ගවේෂණය ගතික හා දීර්ඝකාලීනව සාර්ථක කර්මාන්තයක් බවට පත්කිරීමට අවශ්‍ය සාර්ව තලයේ ප්‍රතිපත්ති සම්පාදනය හා මග පෙන්වීම සඳහා ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ අධිකාරියක් අවශ්‍ය වේ. තෙල් ගවේෂණය ජාතික වශයෙන් ඉතා වැදගත් කාර්යයක් වන බැවින්, තෙල් ගවේශණය සාර්ථක කරගත් බොහෝ රටවල මෙවැනි තීරණ ගැනීමේ ආයතන හෝ කමිටුවල ප්‍රධානත්වය උසුලන්නේ රාජ්‍ය ප්‍රධානියාය.

භූගර්භ විද්‍යාව, භූ භෞතික විද්‍යාව, බලශක්ති ආර්ථික විද්‍යාව හා අවදානම් විශ්ලේෂණය වැනි තෙල් ගවේශණ ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත් ඒකරාශී කිරීම සහ තාක්ෂණික විශේෂඥතාවය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු දියත්කිරීම ඉතා වැදගත්ය.

තෙල් ගවේෂණය ආරම්භයත් සමගම ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා නව ඉල්ලුමක් ජනිත වියහැකි අතර, තෙල් කර්මාන්තය සඳහා ශ්‍රම අවශ්‍යතාවයක්ද, ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රබල ඉදිරි හා පසුපස සබඳතාවන්ද ඇතිවිය හැකිය. මෙහිදී විශේෂයෙන්ම බැංකු, රක්ෂණ, ඉදිකිරීම්, ප්‍රවාහන, උපයෝගී සේවාවන්, තාක්ෂණික හා වෙනත් යටිතල පහසුකම් සම්බන්ධ සේවාවන් සඳහා නව ඉල්ලුමක් ගොඩනැගෙනු ඇත.

එබැවින්, තෙල් ගවේෂණයේ ජාතික වැදගත්කම හා ලෝක වෙළෙපොළේ තෙල් මිල අඛණ්ඩව ඉහළයාම පිළිබඳව සැලකීමේදී ආයෝජකයින් දිරිමත් කිරීමේ හා තෙල් ගවේෂණය හැකි ඉක්මණින් ආරම්භ කිරීමේ හදිසි අවශ්‍යතාවයක් පවතින බව පැහැදිලිය. හිතකර තරඟකාරිත්වයක් නිර්මාණය කිරීම සමඟ නිසි ව්‍යාපාරික පරිසරයක් ගොඩනැංවීම මගින් තෙල් ගවේශණයෙන් රටට උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවනු ඇත. දිගුකාලීන සැලසුම්කරණය, විශ්වසනීයත්වය පවත්වා ගැනීම, තීරණගැනීමේ ක්‍රියාවලියේ පවතින විනිවිදභාවය හා වගකීම් සහගතභාවය ආයෝජකයින් ආකර්ශනය කරගැනීම සඳහා උපකාරී වනු ඇත. එමෙන්ම හයිඩ්‍රොකාබන් පවතින බවට සාක්ෂි ලැබී ඇති කාවේරි ද්‍රෝණිය ඇතුලු ශ්‍රී ලංකාවේ අනෙකුත් මුහුදු ආශ්‍රිත ප්‍රදේශවල ඛනිජ තෙල් සම්පත ගවේෂණය කිරීමේ කටයුතු අප්‍රමාදව ආරම්භ කළයුතුව ඇත.